# නියමුවා

"නිර්ධන පංතිය එහි පංති අරගලයේ යෙදීමෙන් අවබෝධය ලබමින් සහ අධ්‍යාපනය ලබමින්ද, ධනපති සමාජයේ දුර්මතයන් ඉවත දමා ඒවායින් නිදහස් වෙමින්ද, තව තවත් සමීප ලෙස එහි පිරිස් ඒකරාශි කර ගනිමින්ද, තම සාර්ථකත්වයන්ගේ තරම මැනීමට උගෙන ගනිමින්ද සිටියි. එය එහි බලවේගයන් දැඩිකර ගනිමින්, නොවැළැක්විය හැකි ලෙසටම වැඩෙන්නේය."

ලෙනින්

තෝරාගත් කෘති, 1වැනි වෙළුම, 52 පිටුව

ISSN 1391 - 1031 | 2024 මැයි | 28 වෙළුම | 08 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=



NPP මැයි රැලිය - කොළඹ
2024 මැයි 01

# නව පුනරුද යුගය නිර්මාණය කරමින් ලෝකයත් සමග ඉදිරියට යාමට සූදානම්

**සියලු ජන කණ්ඩායම් නියෝජනය කරමින් රට ගොඩනගන මහා ජනතා ව්‍යාපාරය ජාතික ජන බලවේගය බවත් පරණ පක්ෂ කෝන්තර, අදහස්, පැරණි මති මතාන්තර පරණ කුණු සියල්ල පසෙක තැබිය යුතු බවත් පෙන්වා දෙන ජාතික ජන බලවේගය, නූතන ශ්‍රී ලංකාවේ නව පුනරුද යුගය නිර්මාණය කරමින් ලෝකයත් සමග ඉදිරියට යාමට තම පක්ෂය සූදානමින් සිටින බව අවධාරණය කළේය.**

පසුගිය මැයි 01 දින කොළඹදී පැවති මාලිමාවේ මැයි රැලියේදී ජාතික ජන බලවේගය වෙනුවෙන් මෙම අදහස් පළ කළේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා විසිනි. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර සහෝදරයා මෙසේද පැවසීය.

අද ඉතාමත්ම තීරණාත්මක මැයි දිනයක්. මෙය දූෂිත ප්‍රභූ තන්ත්‍රය යටතේ පවත්වන අවසාන මැයි දිනය බව අපි හිතනවා. 2025 මැයි දිනය පවත්වන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් යටතේයි. කොළඹ මැයි දිනය පැවැත්වීමට ජාතික ජන බලවේගයට ඉඩමදි බව අපට තේරුණා. සාමාන්‍යයෙන් අපි යාපනයේ පවත්වන මැයි දිනයට අමතරව අනුරාධපුරය සහ මාතර, කොළඹ ප්‍රධාන මැයි දින තුනක් පවත්වන්න සැලසුම් කළා. මාතර, කොළඹ, අනුරාධපුරය සෑම තැනම එකම එක හිස් ගොඩක් බවට පත්කරමින් මහා ජන ගඟක් ජාතික ජන බලවේගයේ මැයි දිනයට සහභාගී වී සිටිනවා. ජාතික ජන බලවේගයේ අපි ස්ථාන හතරක මේ රට වෙනස් කිරීම සඳහා ඒකමතිකව, එකමුතුව, එක්සත්ව බලවේගයක් ලෙස පෙළගැසී සිටිනවා. ලංකාවේ පළමු වතාවට පොදු ජනතාව අතට බලය මාරුවීම සඳහා කටයුතු යෙදෙමින් තිබෙනවා. ඒ නිසා දූෂිත පාලක ප්‍රභූ පංතිය කලබල වී, අන්දමන්ද වී සිටිනවා.

ජාතික ජන බලවේගයේ අපි, අප වෙත පවතින ජනතාවගේ කැමැත්ත මහජන බලයක් බවට පත්කිරීමේ සැලසුම් සකස් කර, ක්‍රියාත්මක කළා. අපි නිවැරදිව ගම සංවිධානය කළා. මෙතන සිටින බොහෝ දෙනෙක් කොට්ඨාස සභාවක සාමාජිකයන්. අපේ රටේ කාන්තාවන් දේශපාලනය සම්බන්ධයෙන් අඩු උනන්දුවක් තිබෙන අය නිසා, දේශපාලන පරිවර්තනයකට ඒ අයව සහභාගී කර ගැනීමට කාන්තා සභා ගොඩනගා දිස්ත්‍රික් සමුළු පවත්වා වැඩේ තිතට කළා. ලංකාවේ සංවිධානාත්මකම කාන්තා ව්‍යාපාරය ජාතික ජන බලවේග යෙන් ගොනගා තිබෙනවා. ඒ වගේම අපේ රටේ අධිකරණවලින් 80% කට වැඩි ප්‍රමාණයක ජාතික ජන බලවේගයේ නීතිඥ සංවිධාන පිහිටුවා අවසන්. ඉංජිනේරුවන් ආයතනික මට්ටමින් සහ දිස්ත්‍රික්ක මට්ටමින් සංවිධානය කර, ජූලි 01වැනි දින ඔවුන්ගේ සමුළුව පවත්වනවා. විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකය ජනරාල්වරුන්ගේ සිට සාමාන්‍ය සොල්දාදුවා දක්වා ප්‍රබලතම ලෙස ගොඩනගා තිබෙනවා. අපේ රටේ ශිෂ්ටාචාරය සහ ඉතිහාසය තුළ විශාල කාර්යභාරයක් ඉටුකළ හාමුදුරුවන් වහන්සේලා සමග සාකච්ඡා කරමින් විශාලතම භික්ෂු ව්‍යාපාරය ගොඩනගා ජූලි මාසයේ අග වන විට දැවැන්තම භික්ෂු සමුළුව පවත්වන්න සූදානම් කර තිබෙනවා. අනෙකුත් පියතුමන්ලාත්, කුරුක්කල්තුමන්ලාත් සමග සාකච්ඡා කරමින් සිටිනවා. මේ අනුව ජාතික ජන බලවේගය ඉතාමත්ම සංවිධානාත්මක බලවේගය ලෙස අප විසින් ගොඩනගා තිබෙනවා. විශ්‍රාමික පොලිස් සාමූහිකය ජූනි මාසයේ දෙවැනිදා ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික පොලිස් ප්‍රධානීන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන්න සැලසුම් කර තිබෙනවා. ලංකාවේ මුළු දේශපාලනයම ජාතික ජන බලවේගය කේන්ද්‍රගතකොට ගෙන හසුරුවන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ හැර අනෙක් සියල්ල අපේ පිටුපසින් එන දේශපාලනයක් වෙලා තිබෙනවා. ජයග්‍රාහී පියවරකට ජාතික ජන බලවේගය ඔසවා තබමින් ලංකාවේ දේශපාලනය සම්බන්ධ ප්‍රබලම භූමිකාව ඉටුකරමින් සිටිනවා.

සමහර අය ගණිතයෙන් කියනවා 3%, 51%ක් වෙන්නේ කොහොමද කියලා. ලක්ෂ තුන හමාරක් හතරක් තිබුණු ඡන්ද ලක්ෂ හැත්තෑව වෙන්නේ කොහොමද කියලා ප්‍රශ්න කරනවා. ඊට වඩා සජිත් කිට්ටු බව කියනවා, දේශපාලනය කියන්නේ වීජ ගණිතය නොවෙයි. දේශපාලනය කියන්නේ සමාජ විද්‍යාවක්. දේශපාලනය කියන්නේ වීජ ගණිතය නම් ලක්ෂ 69ක් ගත් ගෝඨාභය තවමත් ජනාධිපති වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ 2/3ක් ගත් මහින්ද තවමත් අගමැති වෙන්න ඕනෑ. අද

***02වැනි පිටුවට***


**03 රටේ පරිවර්තනයට...**

ඉතාම කෙටියෙන් කිවුවොත් අපි නිෂ්පාදනය මත පදනම් වූ ශක්තිමත් ස්ථාවර ආර්ථිකයක් ගොඩනගන්න ඕනෑ. ඒ ආර්ථිකයට ආර්ථික බලවේග වගේම ජනතාවත් සම්බන්ධ කර ගන්න...



**05 හොඳින් කියවා ගත යුතු...**

දැන් සමාජ චින්තනය ස්ථිරවම වෙනස් වී ඇත. කිසිවෙකුට එය ආපසු හැරවිය නොහැක. අලුත් වෙනසක් වෙනුවෙන් පොදු ජනයා පැරණි දේශපාලනය අත්හැර...



**09 යශෝධරාව හා...**

දුෂ්කර ජීවිතයක් ගත කරද්දීත් සිය සැමියාගේ සියලු අකටයුතුකම් ඉවසන ගැහැනියක්, ඔහු සිය සීමාව ඉක්මවා ගිය විගස දෙවරක් නොසිතා ගන්නා තීරණාත්මක ක්‍රියාවක් ගැන...



තරුණ.................................. 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය ............................ 07
කාන්තා.................................. 08
විශේෂාංග........................... 10
වේදිකාව.................................11


***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# සංවර්ධන නිලධාරීහු
## රට පුරා විරෝධතා පවත්වති




විමධ්‍යගත වැඩසටහන් ක්‍රියාත්මක කරන ආර්ථික සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රධාන ඉල්ලීම් ලෙස රු. 7500ක දීමනාවක් ලබාදීම, කාර්යාල දීමනාව රු. 750ක් ලබාදීම ප්‍රමාණවත් නොවීම නිසා අවමය රු. 3000ක් ලබාදීම, ලිපිද්‍රව්‍ය සඳහා සාධාරණ මුදලක් ලබාගැනීම යන ඉල්ලීම් මුල්කරගෙන පසුගිය දා ආර්ථික සංවර්ධන නිලධාරීහු අසනීප නිවාඩු වාර්තා කරමින් රට පුරා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඉදිරිපිට උද්ඝෝෂණ ව්‍යාපාර පැවැත්වූහ.

මේ සම්බන්ධයෙන් සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා පවසන්නේ පවතින ආර්ථික වියදම් හමුවේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන නිලධාරීන්ට කෙසේවත් පවත්වාගෙන යාමට නොහැකි බවත් එබැවින් මෙම ඉල්ලීම් ලබාගැනීමට අඛණ්ඩ සටනක් ක්‍රියාත්මක වුවද කටයුතු කිරීමට සූදානම් බවය.

# උතුරු පළාත් ගුරු සමුළුව මුළුදෙයි




'අධ්‍යාපනය ඉවරයි - ගුරු-සිසු අයිතීන් දිනන්නේ කෙසේද?' මැයෙන් ලංකා ගුරුසේවා සංගමය විසින් රට පුරා පවත්වන දිස්ත්‍රික් සමුළු මාලාවේ උතුරු පළාත් සමුළුව පසුගියදා යාපනය වලම්බුරි සංගිලියන් ශාලාවේදී ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ එහි ජාතික සංවිධායක සුන්දරලිංගම් ප්‍රදීප්, ජාතික ජන බලවේගයේ යාපනය දිස්ත්‍රික් විධායක සභික රාමලිංගම් චන්ද්‍රසේකර් යන සහෝදරවරුන්ගේද සහභාගිත්වයෙන් පැවැත්වුණු මෙම සමුළුව උතුරු පළාත නියෝජනය කරමින් ගුරු සංගම් සාමාජක සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# හෙද සේවයේ ගැටලුවලට
## විසඳුම් ඉල්ලා රට පුරා විරෝධතා



වසර ගණනාවක් තිස්සේ නොවිසඳී පවතින හෙද සේවාවේ දීමනා ගැටලු ඇතුළු තවත් ගැටලු ගණනාවකට විසඳුම් දෙන ලෙසට බලකරමින් රට පුරා රෝහල් 100ක පමණ හෙද හෙදියෝ පසුගියදා පැය 3ක සේවයෙන් ඉවත්ව විරෝධතා උද්ඝෝෂණ පැවැත්වූහ. ඒ අනුව කොළඹ ජාතික රෝහල ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්වූ අතර මීට අමතරව මහනුවර, පේරාදෙණිය, කරාපිටිය, අනුරාධපුර, කුරුණෑගල, මාතර, හම්බන්තොට වැනි ප්‍රධාන රෝහල්වලදීද මෙම විරෝධතාවයන් පැවැත්විණි.

හෙද සේවයේ ප්‍රධාන ගැටලු ලෙස පොරොන්දු වූ නිදිවර්ජිත, අනතුරු හා ප්‍රවාහන දීමනා ලබාග ැනීම, නිල ඇඳුම් දීමනාව වැඩිකර ගැනීම, භාණ්ඩ භාරකාරත්ව දීමනාව යාවත්කාලීන කරගැනීම, හෙද නිලධාරීන්ගෙන් කොල්ලකන ලද හිඟ වැටුප ලබාගැනීම, හෙද සේවාව විනාශ කර දමන අමාත්‍යාංශ කෙටුම්පත් කර ඇති සැලසුම් වහා ඉවත් කිරීම, හෙද නිලධාරීන් සේවාවට බඳවා ගැනීම, ප්‍රමිතිගත හෙද විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම යන ප්‍රධාන ඉල්ලීම් වේ. මෙහිදී ජාතික රෝහලේ පැවති විරෝධතාවය සඳහා සමස්ත ලංකා හෙද සංගමයේ ප්‍රධාන ලේකම් එස්.බී. මැදිවත්ත, ජාතික සංවිධායක අමිල රත්නායක යන සහෝදරවරුද සහභාගි වූහ. මෙහිදී ජනාධිපතිවරයා වෙත භාරදීම සඳහා පෙත්සමක්ද අත්සන් කරනු ලැබිණි.

# ජන පීඩක විදුලි පනතට
## වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ විරෝධය




රනිල් - රාජපක්ෂ ආණ්ඩුව විසින් ගෙන එන ලද නව විදුලි සංශෝධන පනත මගින් විදුලි පරිභෝගිකයන් හට තිබූ අවම ආරක්ෂණයත් අහිමි වී යන බව සඳහන් කරමින් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය දැඩි විරෝධය පළ කර සිටී. ආණ්ඩුව විසින් IMF වුවමනාව වෙනුවෙන් රටේ ජාතික සම්පත් විකුණමින් ගෙන යන ආර්ථික වැඩපිළිවෙළ මගින් මෙලෙස නව විදුලි පනත ගෙන ඒම තුළ දැවැන්ත ආර්ථික පීඩනයන්ට ගොදුරු වී සිටින රටේ ජනතාව තව තවත් පීඩාවට පත්වීම නොවැළැක්විය හැකි බවත් එබැවින් මෙම විදුලි පනත පරාජයට පත්කිරීමට කටයුතු කරන බවත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මාධ්‍ය හමුවක් පවත්වමින් අවධාරණය කළේය. පසුග ියදා පැවැත්වූ මෙම මාධ්‍ය හමුව සඳහා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශ නියෝජනය කරමින් වෘත්තීය සමිති නායකයෝ රැසක් සහභාගි වූහ.

එසේම ආණ්ඩුව විසින් බලහත්කාරී ලෙස ගෙන ඒමට කටයුතු කරන මෙම පනත පරාජය කිරීම සඳහා වෘත්තීය සමිති ඇතුළු සියලු ජනතාව පෙළගැස්වීමට කටයුතු කරන බවත් මෙහිදී වෘත්තීය සමිති නායකයෝ කියා සිටියහ. එසේම රටේ ස්වාධීනත්වයට බලපාන ජාතික සම්පත් විකුණන ආණ්ඩුව පරාජයට පත්කොට නව ජනතාවාදී රජයක් මගින් මෙම ජාතික සම්පත් රැක ගැනීමට අඛණ්ඩව කටයුතු කරන බවද මෙහිදී ඔවුහු පැවසූහ.

# නව පුනරුද යුගයක්... 01 පිටුවෙන්

ඒගොල්ලෝ වේදිකාවේ කියන්නේ පස්වන විධායක ජනාධිපති කියලයි. දේශපාලනය වෙනස් වෙන්නේ, අනුක්‍රමිකව නොවෙයි, පිම් ලෙස. ජාතික ජන බලවේගය අද සෑදී පැහැදී ඉන්නේ ලංකාවේ විශාලතම දේශපාලන පිම්ම ගන්නයි. සමීක්ෂණ පැත්තක තැබුවත් පොළොවේ තිබෙන යථාර්ථයෙන් පෙන්වන්නේ ජයග්‍රහණය කරා ළඟා වෙමින් තිබෙන බවයි.

අපි පොඩි වැඩකට අතගහන්න නොවෙයි මේ එන්නේ. අවුරුදු 76ක් ගමන් කරමින් තිබෙන පාර වෙනස් කිරීමටයි එන්නේ. අවුරුදු 76ක් පුරා ඇබ්බැහි වුණු රාජ්‍ය යාන්ත්‍රණයක් තිබෙනවා. ඇබ්බැහි වුණු ජනතාවක් ඉන්නවා. පුරුද්දට ඇබ්බැහි වුණු සමාජයක් තිබෙනවා. මේ පාරේ යන්න මෙහෙයවීමක් අවශ්‍ය නැහැ. පුරුදු පාරේ යනවා. මෙය පරිවර්තනය කිරීමට නම්, පළමු කොටම සාතිශය බහුතරයක් ජනතාවගේ අනුමැතියක් අවශ්‍යයි. ශක්තිමත් මහජන බලයක් අවශ්‍යයි. ඉදිරි මාස තුනේ ගෙයින් ගෙට යන්න. හැම පුරවැසියෙක්ම හමුවෙන්න. රටට සිදුකර තිබෙන විනාශය කියලා දෙන්න. මේ තත්වය වෙනස් කිරීම සඳහා ජාතික ජන බලවේගයට තිබෙන වැඩපිළිවෙළ පැහැදිලි කර දෙන්න. ගම් පිටින් මාලිමාව ජයග්‍රහණය කරවීම සඳහා පොරබදන සමාජයක් නිර්මාණය කරන්න.

මානව හැඟීමක් තිබෙන ඕනෑම කෙනෙකුට විවෘත වුණු පුළුල්තම වේදිකාව තමයි ජාතික ජන බලවේගයේ වේදිකාව. මහජනයාගේ ධනය කෝටි ප්‍රකෝටි ගණන් සොරකම් කරන දේශපාලනය නතර කරන්න ඕනෑ. මහජනයාගේ ධනය කොල්ල කන සාම්ප්‍රදායික දේශපාලනය වෙනස් කර, එම ධනය සාංඝික දේපොළක් වගේ ආරක්ෂා කරන නව දේශපාලන සංස්කෘතියක්, සම්ප්‍රදායක් අපි ගෙන එනවා. අපි ලැහැස්ති වෙන්නේ රටට නව ආර්ථික උපායමාර්ගයක් ගේන්නයි. නැවත කාර්මික යුගයකට රට පරිවර්තනය කරන්න අපි ලැහස්තියි. ඒ සඳහා ප්‍රාග්ධනය, තාක්ෂණය, අමුද්‍රව්‍ය, නිපුණතාවය සහිත ශ්‍රම බලකායක් ඕනෑ. ඒ නිෂ්පාදනය කරන භාණ්ඩ විකිණීම සඳහා ශක්තිමත් වෙළඳපොළක් ඕනෑ. අම්මාගේ බරෙනුත්, දරුවාගේ බරෙනුත් නිදහස් කරගත් ලෝකයක් එක්ක පෙරට යන දැනුම් සම්භාරයක් සහිත අධ්‍යාපනයක් හඳුන්වා දෙනවා.

අපේ මුළු කෘෂිකර්මාන්තයම කාබාසිනියා කරලා. එයට නැවත පණ දෙන්න ඕනෑ. නාවික කර්මාන්තයෙන් රට ඉදිරියට ගෙන යන්න ආර්ථික සැලසුම් දියත් කරන්න ඕනෑ. අපි ගොවි ජනතාව, ධීවර ජනතාව, තරුණ පරම්පරාව, ආර්ථිකයට සම්බන්ධ කර ගන්නා නව ක්‍රියාමාර්ග දියත් කරනවා. ආර්ථිකයෙන් ලබා ගන්නා ඵල සාධාරණ ලෙස ජනතාව අතර බෙදෙන්න ඕනෑ. සමාන ලෙස නොවෙයි. වැඩකරන කෙනාට සාධාරණ පංගුවක් ලැබෙන්න ඕනෑ.

අපි එන්නේ මේ ගහගෙන යන පාරේම ගහගෙන යන්න නොවෙයි. මේ ගහගෙන යන ගඟේ කඩදාසි ඔරු අරින්න පුළුවන් සජිත් ප්‍රේමදාසට. වෙන මොකවත් කරන්න බැහැ. නමුත් අපි එන්නේ මෙය සම්පූර්ණයෙන්ම අලුත් දිසාවකට හරවන්න. නව දේශපාලන සංස්කෘතියක් නව ආර්ථික ගමනක් සහෝදරත්වය, ළෙන්ගතුකම පිරුණු සමාජයක් ගොඩනගන්න. අපි අත ගහන්නේ හුදු ජනාධිපති පුටුවේ වාඩිවෙන්න ආණ්ඩුවක් හදන්න නොවෙයි. අපි අත ගහන්නේ නව පුනරුද යුගයක් බිහි කරන වැඩකට.

# මාලිමාව සිටින්නේ කුමන්ත්‍රණවලින් වට්ටන්න පුළුවන් තැනක නොවෙයි



### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

**සතුරන් එකතු වී මාලිමාවේ ජයග්‍රහණය වළක්වන්න සැලසුම් සකස් කරන බවටත් බඩු බෙදා, අල්ලස් දී, ඡන්ද කල් දමා මාලිමාවේ ජයග්‍රහණ වැළැක්වීමට නොහැකි නිසා මාලිමාව දෙකඩ කිරීමට බොරු ප්‍රවෘත්ති නිර්මාණය කරමින් සිටින බවටත් චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, කවුරුන් බෙදුණත්, මාලිමාව වටා ඒකරාශි වී සිටින ජනතාව බෙදන්නට ඔවුන්ට නොහැකි බවත් මාලිමාව සිටින්නේ කුමන්ත්‍රණවලින් වැට්ටිය හැකි තැනක නොවන බවත් රට ගොඩනැඟීමේ අධිෂ්ඨානයෙන්, ධෛර්යයෙන් ඉදිරියට යන එකම බලවේගය මාලිමාව පමණක් බවත් ප්‍රකාශ කළේය.**

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 01වැනිදා මාතර වෙරළ උද්‍යානයේ පැවති ජාතික ජන බලවේගයේ මැයි රැලිය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

මේ තමයි, ජාතික ජන බලවේගයේ ශක්තිය, ජාතික ජන බලවේගයේ විශ්වාසය. අපි කවුරුත් එකතු වෙලා අවුරුදු කිහිපයකින් ගොඩනැගූ මහා මිනිස් සමූහය තමයි, මේ. අපි කොතරම් ශක්තිමත්ද කියලා සතුරන්ට පෙනීගොස් තිබෙනවා. මාතර වෙරළ තීරයේ ලක්ෂයකට වැඩි ජනතාවක් වාගේම අනුරාධපුරයේත් පිරී ඉතිරී සිටිනවා. කොළඹ ඒ සියල්ල ඉක්මවා ගිය පිරිසක් ජාත්‍යන්තර කම්කරු දිනය සමරනවා. 1886 අවුරුද්දේ එදා සිටි පාලකයන් මර්දනය දියත් කිරීමෙන් ජාත්‍යන්තර කම්කරු දිනය නිර්මාණය වුණා. අයිතිවාසිකම් ඉල්ලා පාරට බහින ජනතාව මර්දනය කළ මේ රටේ පාලකයන් අද මැයි දිනය සමරනවා. රනිල් වික්‍රමසිංහගේ මාමා 1987 මැයි දිනය තහනම් කර නාරාහේන්පිට අභයාරාමයට වෙඩි තබා දෙදෙනෙක් ඝාතනය කළා. ඔවුනුත් මැයි දිනය සමරනවා.

එක්සත් ජාතික පක්ෂය, පොදුජන පෙරමුණ, සමගි ජන බලවේගය කියන පක්ෂ ඔක්කොම යල්පැනගොස් ජනතාවගෙන් ඉවත් වී ඉතිහාසයේ කුණුබක්කියට වැටෙමින් තිබෙන බවත්, ඉතිහාසය අලුතින් ලියන අධිෂ්ඨානය සහිත සියලු ප්‍රගතිශීලී ජනතාව ජාතික ජන බලවේගය සමඟ අත්වැල් බැඳ ගනිමින් සිටින බවත් ඔප්පු කරමින් තිබෙනවා. මෙතැනට රැස් වී සිටින කිසිවකුටත් පොරොන්දු දීලා, අරක්කු දීලා, සල්ලි දීලා ගෙනැත් නැහැ. හැමෝම කොට්ඨාස සභා මට්ටමින්, ආධාර පත්‍රවලින් සල්ලි එකතු කර කෑම පැකට් එකක් අරගෙන දුෂ්කරතා මැද්දේ මෙතැනට ආව ලක්ෂ ගණනක් දෙනා ඉන්නේ. ඔවුන්ගේ ගමන වෙනස් කරන්න කිසිවකුටත් බැහැ. රට ගොඩනැඟීමේ විනයක් සහිත ස්වේච්ඡාවෙන් වැඩ කරන බලවේගය මාලිමාව පමණක් බව ඔබ, අප හැම දෙනාම ඔප්පු කොට තිබෙනවා. මෙතැන ඉන්නේ ගල් පර්වත වුවත්, අස්වැද්දිය හැකි බව ක්‍රියාවෙන්ම ඔප්පු කළ අධිෂ්ඨානශීලී ජනතාවක්. තවමත් අප වෙත එකතු නොවූ ජනතාවත් ඒකරාශී කරගෙන ඉතිහාසයේ පළමුවරට ජනතාවගේ ආණ්ඩුවක් පිහිටුවන බව ශපථ කරන ජනතාවක් මෙතැනට ඒකරාශී වී සිටින්නේ.

අවුරුදු හැත්තෑහයක් පුරා අපේ ඡන්දයෙන් පත් වුණු පාලකයන් අපට පෙරළා ලබා දී තිබෙන්නේ බංකොළොත් තත්ත්වයට පත් කළ රටක්. ඒ බංකොළොත් රට තුළ මේ දවස්වල පුංචි පුංචි ඡන්ද ක්‍රීඩා පටන්ගෙන තිබෙනවා. ජනතාව අපායේ ජීවත් කරවමින්, ඡන්ද කාලයේ දී ඒ අපායට පොඩි ඉන්ටවල් එකක් දීම මේ දක්වා පාලකයන් සිදු කළා. ඡන්ද කාලයට මොනවා හරි බෙදලා, දිළිඳුකම වපුරලා ඡන්දය ගන්න රනිල් වික්‍රමසිංහලා හාල් කිලෝ විස්සක් බෙදනවා. මේ දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කරන්න ඕනෑ. ඒ වාගේම වංචාව, දූෂණය, නාස්තිය වළක්වා හොරුන්ට දඬුවම් දෙන්නත් ඕනෑ. හොරාකෑ හැම සතයක්ම ආපසු අය කර ගන්නත් ඕනෑ. ඒ වෙනුවෙන් තිබෙන එකම බලවේගය ජාතික ජන බලවේගය පමණක් බව අපි ජනතාවට සහතික කර කියා සිටිනවා. මහජන නියෝජිතයා කියලා මේ දක්වා පත් කළ මන්ත්‍රීවරු, ඇමැතිවරු මහජන මුදල් නාස්ති කරමින්, ආරක්ෂකයන් පිරිවරාගෙන යන පාරක් හැදුවත්, තවත් මහජන මුදල් වැය කරමින්, ඇමැති අතින් පීත්ත පටි කැපීමේ සංස්කෘතිය අපි සහමුලින්ම

11 වැනි පිටුවට

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# මැයි දින අදිටන

ලොව පුරා වැඩකරන ජනතාව ඇතුළු පොදු ජනතාව මෙවරද ජාත්‍යන්තර කම්කරු දිනය සමරනු ලබන්නේ අභියෝග රැසක් ඉදිරිපිට සිටය.

දිනපතා අර්බුදයට යන අධිරාජ්‍යවාදය තුළ යල්පැනයන ධනවාදී පාලනයක් තුළ වැඩකරන ජනතාව ඇතුළු පොදු ජනතාවෝ විශාල දුෂ්කරතාවයන්ට, ජීවන තත්වයේ විශාල කඩා වැටීම්වලට මුහුණදී ජීවිතයේ අවම අවශ්‍යතාවන් සපුරා ගැනීමට නොහැකිව සිටිති.

මැයි දිනය යනු 1886 දී එක්සත් ජනපදයේ චිකාගෝ නුවර කම්කරුවන් පැය 8ක වැඩ දිනයක් ඉල්ලා කළ අරගලයත් එම අරගලය පාලක පක්ෂය විසින් මර්දනය කරද්දී අරගලය වෙනුවෙන් දිවි පිදූවන් සිහිකිරීමත් අරමුණු කරගෙන පැවැත්වෙන සැමරුමකි. චිකාගෝවල කම්කරුවන් පැය 8ක වැඩ දිනයක් වෙනුවෙන් අරගල කොට එය දිනා ගත්තද නව ලිබරල් ධනවාදය තුළ යළිත් එම පැය 8ක වැඩ දිනය වැඩකරන ජනයාගෙන් උදුරාගෙන තිබේ. ජීවිතය යන්තමින් ගැට ගසා ගැනීමට පැය 8 ඉක්මවා වැඩ කිරීමට සියලු දෙනාට බල කරනු ලැබ තිබේ.

මේ වනවිට ලංකාව තුළ තත්වයද එසේය. වරින් වර වැඩකරන ජනතාව විසින් අරගල කොට දිනාගනු ලැබූ බොහෝ අයිතිවාසිකම් අර්බුදයට ගිය පාලක පන්තිය විසින් යළි උදුරාගනිමින් සිටී. රට ආර්ථික වශයෙන් බංකොලොත් කරනු ලැබ තිබේ. ගෙවාගත නොහැකි ණය බරක් ජනතාව මත පටවනු ලැබ තිබේ. බඩු මිල දිනපතා ඉහළ යද්දී, වැටුප් හෝ ආදායම් වැඩි නොවෙද්දී විශාල බදුබරක් දැරීමටද ජනතාවට සිදුව තිබේ.

ලංකාවේ වසර 76ක පාලනය තුළ, විශේෂයෙන් 1977න් පසු අනුගමනය කළ කොල්ලකාරී විවෘත ආර්ථිකය හෙවත් නව ලිබරල් ධනවාදය තුළ මුළු රටම ආර්ථික, සමාජයීය, දේශපාලන හා සංස්කෘතික යන සියලු අංශවලින් බිඳ වට්ටවා තිබේ.

මේ තත්වය තුළ ධනේශ්වර ප්‍රභූ පාලක කල්ලිවලින් ඔවුන්ගේ පාලනයන්ගෙන් තවදුරටත් අයිතීන් ඉල්ලීමෙන් පලක් නැත. වැඩකරන ජනයා ඇතුළු පොදු ජනයාගේ අයිතීන් ලබාදීමට හැකියාවක් නැති පාලකයන් දැන් කරමින් සිටින්නේ ජනතාව දිනාගත් අයිතීන් පවා අහිමි කිරීමය.

මේ නිසා මෙවර මැයි දිනයේ වැඩකරන ජනයා ප්‍රමුඛ පීඩාවට පත් සියලු බලවේගයන්ගේ අරමුණ විය යුත්තේ මේ බංකොලොත්, දුෂ්ට පාලනය පෙරළා දමා ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා බලමුළු තර කිරීමය; නව සමාජ පරිවර්තනයක් වෙනුවෙන් සටන් කිරීමය.

ලංකාව වට්ටවා ඇති මේ විනාශකාරී අගාධයෙන් ගොඩගෙන රට ගොඩනැගීමට නම් ඒ වෙනුවෙන් ජනතාව පෙළගැස්විය යුතුව තිබේ. නව සමාජයක් වෙනුවෙන් ජනතාව අවදි කර විය යුතුය. ඒ සඳහා ජාතික පුනර්ජීවනයක් අවශ්‍ය වේ. සැබෑ ජාතික නිදහස දිනාගැනීමේ නව පන්නයේ ජාතික නිදහස් අරගලයක්ද අප ඉදිරියේ තිබේ.

රටේ සම්පත් විකුණමින්, මහජන ධනය හොරාකමින්, නාස්ති කරමින් ගෙන යන චෞර වලල්ලේ පාලනය වහාම අවසන් කළ යුතුව තිබේ. රට තුළ සැබෑ ජනතාවාදී පාලනයක් ස්ථාපිත කර සමාජයේ ගැඹුරු පරිවර්තනයකට, ආර්ථික, සමාජයීය, දේශපාලන වෙනසකට අඩිතාලම දැමිය යුතු වේ. දැන් ජනතාව ඒකරාශි කළ යුත්තේ ඒ වෙනුවෙනි.

එබැවින් මෙවර ජාත්‍යන්තර කම්කරු දිනයේ වැඩකරන ජනයා ප්‍රමුඛ පීඩාවට පත් පොදු ජනයාගේ අරමුණ විය යුත්තේ ප්‍රතිගාමී පාලකයින්ගෙන් අයිතීන් ඉල්ලීම වෙනුවට ප්‍රතිගාමී දුෂ්ට පාලනය අවසන් කර නව ජනතාවාදී පාලනයක් ගොඩනැගීමය. රට හදන විසඳුමට ජන බලය පෙළ ගැස්වීම මෙම මැයි දිනයේ අපේ අදිටන හා ඉලක්කය විය යුතුය.

ලංකාව දැන් තිබෙන්නේ ජනාධිපතිවරණයක් ඉදිරිපිටය. එම ජනාධිපතිවරණය අපේ රටේ ඓතිහාසික වෙනසකට මුල පුරන ජනාධිපතිවරණයක් වෙනවාට සැක නැත. මෙවර ශ්‍රී ලාංකේය වැඩකරන ජනයා ඇතුළු පොදු ජනයා මැයි දිනය සමරන්නේ බලය මාරු කළ හැකි දේශපාලන වටපිටාවක් තුළය. ඒ සඳහා දැන් අවස්ථාවක්ද ලැබී තිබේ.

එබැවින් 76 වසරක සාපකාරී කුරිරු පාලනය නිමාකර අලුත් රටක්, නව සමාජයක් ගොඩනැගීම සඳහා වැඩකරන ජනයා ප්‍රමුඛ පොදු ජනතාවගේ පාලනයක් සඳහා බලවේග පෙළගැස්වීම මේ මැයි දිනයේ අප සැමගේ අදිටනත් අරමුණත් කරගත යුතුය.

# රටේ පරිවර්තනයට ජනතාව දායක කරගැනීමට අපි සූදානම්



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

***මැයි 1දා ඔබලා ජාතික ජන බලවේගය ලෙස සාර්ථක මැයි රැලි හා පෙළපාලි කිහිපයක් පැවැත්වූවා. මැයි දින සැමරුම පිළිබඳව මොකද හිතෙන්නේ?***

ඇත්තටම ඔව්. අපි ජාතික ජන බලවේගය ලෙස පවත්වපු පළමු මැයි දිනය මේකයි. අපි යාපනය, අනුරාධපුර, කොළඹ හා මාතර මැයි දින රැලි 4ක් කළා. විශේෂයෙන් කොළඹ, අනුරාධපුර, මාතර දැවැන්ත පෙළපාළි තුනක් හා රැලි 3ක් පවත්වන්න අපට පුළුවන් වුණා. මේ තුන් පලේ හැම රැලියකම ලක්ෂය ඉක්මවූ ජනතාවක් සහභාගි වුණා. ලංකා ඉතිහාසයේ වැඩිම ජනතා සහභාගිත්වයක් සහිතව එක පක්ෂයක් විසින් එකම දින රැලි 4ක් පවත්වන ලද මැයි දිනය ලෙස මෙම මැයි දිනය ඉතිහාසගත වෙනවා. අප සමග පෙළග ැසුන ජනතාවගේ තිබුණ උද්යෝගය උනන්දුව ඉතා ඉහළයි. ඒ නිසා මේ වසරේ නව ජනතාවාදී පාලනයක් ගොඩනැගීමට ජනතාව සූදානම් කියන පණිවිඩය මෙහිදී දකින්න පුළුවන් වුණා.

***මැයි දිනය නිමා වීමත් සමග කවුරුත් ඉදිරි ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන වැඩ කරනවා. ජනාධිපතිවරණය සඳහා ඔබලාගේ සූදානම හා එහි අභියෝග මොනවාද?***

2024 ජනාධිපතිවරණය අපේ රටේ දේශපාලනයේත්, ආර්ථිකයේත්, සමාජයේත් ගැඹුරු වෙනසකට මග හදන හැරවුම් ලක්ෂයක් වෙන බව දැන් ඉතාම පැහැදිලියි. වසර 76ක් තිස්සේ බොරුවට දෙකට බෙදිල හිටපු එකම පාලක කණ්ඩායමකට මාරුවෙන් මාරුවට බලය දීලා හෙම්බත් වුණු ජනතාව දැන් ප්‍රබල දේශපාලන වෙනසක් සඳහා අධිෂ්ඨානයෙන් පෙළග ැසෙමින් ඉන්නවා. ඔවුන් එම වෙනස සඳහා ජාතික ජන බලවේගය තෝරාගෙන තියෙනවා. මැයි දින රැලිවලදීත් අපි දැක්කේ ඒ ජනතා අධිෂ්ඨානය තමයි. ජනාධිපතිවරණයට අපි ඉතාම හොඳ සූදානමක ඉන්නවා. දැනට ඉදිරිපත් වීමට නියමිත ජනාධිපති අපේක්ෂකයින් අතර දක්ෂතම, හොඳම හා ප්‍රබලම අපේක්ෂකයා ඉන්නේ අපට. ඒ, අනුර දිසානායක සහෝදරයා.

ඒ වගේම අපි මේ වනවිට රට පුරාම බිම් මට්ටමෙන් කොට්ඨාස සභා පිහිටුවා, ආසන, දිස්ත්‍රික් සමුළු පවත්වා තියෙනවා. ඒ වගේම අපට එකතු කළ හැකි, එකතු කළ යුතු සියලු බලවේග අපි එකතු කර ගනිමින් ඉන්නවා. මේ වන විට රට තුළ විවිධ ආයතන හා පුද්ගලයන් විසින් සිදුකර තියෙන සියලුම ජනමත සමීක්ෂණවල අපි ඉදිරියෙන්ම ඉන්නවා. ඒ නිසා අපිට ජයග්‍රහණය පිළිබඳ හොඳ විශ්වාසයක් තියෙනවා.

***මෙහිදී ඔබ ඉදිරියේ තියෙන අභියෝග මොනවාද?***

ඔව්. එකක් තමයි පසුගිය දශක කීපය තුළ රට පාලනය කළ රටේ මහජන ධනය හොරා කෑ, රට බංකොලොත් කළ පාලක කල්ලි දැනට ඔවුන් අතේ තිබෙන බලය පහසුවෙන් අපට ගැනීමට ඉඩ නොදෙන බව අපි දන්නවා. දැන් ඔවුන් සියලු දෙනාම මාලිමාවට එරෙහිව එක පෙළට එකතුවෙලා ඉන්නේ.

මඩ ගැසීම්, අවලාද නැගීම්, විවිධ විකෘති කිරීම්වල සිට කුමන්ත්‍රණ, ඝාතන, ජාතිවාදය, ආගම්වාදය ඇවිළවීම් දක්වා වුණත් ඔවුන්ගේ ක්‍රියාකාරකම් සිදුවෙන්න පුළුවන්. අපි ඒ ගැන විමසිල්ලෙන් ඉන්නෙ. ඔවුන් පසුගිය කාලය පුරා හොරා කෑ ධනය වියදම් කරලා ඡන්ද දායකයා මිලදී ගැනීමට උත්සාහ කරාවි කියලත් අප දන්නවා. ඒවට මුහුණ දෙන්න අපි සූදානම්. මේ ජනතා මතය, මහජන බලය ආපසු හරවන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ.

අනෙක් අතට මේ වට්ටපු රට ගොඩ ගැනීමේ අභියෝගයත් අපට තියෙනවා. රට මත විශාල ණය බරක් තියෙනවා. ආර්ථික වශයෙන් රට බංකොලොත් කරලා තියෙන්නේ. රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ව්‍යාපාර විශාල ප්‍රමාණයක් කඩා වට්ටලා. රටේ වටිනාම සම්පත් විකුණා දමලා. සමාජය තුළ විශාල පිරිහීමත් අරාජිකත්වයත් නිර්මාණය කරලා. ඉතිං මෙවැනි තත්වයේ තියෙන රටක් යළි ගොඩ ගැනීම ගොඩ නැගීම පහසු නැහැ. ඒ අභියෝගයත් අප ඉදිරියේ තියෙනවා.

***වට්ටපු රට ගොඩනැගීම සඳහා ජාතික ජන බලවේගය සතුව තිබෙන වැඩපිළිවෙළ හා ක්‍රියාමාර්ග ගැන පැහැදිලි කිරීමක් කළොත්?***

අපේ රටේ බංකොලොත් කරපු ආර්ථිකය යළි ගොඩනගන්න නම් මෙතෙක් ආණ්ඩු අනුගමනය කරපු බංකොලොත්, විනාශකාරී ආර්ථික ගමන් මගෙන් අපි තීරණාත්මකව ඉවත් වෙන්න ඕනෑ. ණයට කන, රටේ සම්පත් විකුණන ආර්ථිකය වෙනුවට වත්කම් උපයන ආර්ථික මාවතකට අප යා යුතු වෙනවා. ඒ සඳහා ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළක් අපට තියෙනවා.

ඉතාම කෙටියෙන් කිවුවොත් අපි නිෂ්පාදනය මත පදනම් වූ ශක්තිමත් ස්ථාවර ආර්ථිකයක් ගොඩනගන්න ඕනෑ. ඒ ආර්ථිකයට ආර්ථික බලවේග වගේම ජනතාවත් සම්බන්ධකර ගන්න ඕනෑ. ඒ කියන්නේ ජන සහභාගී ආර්ථිකයක්. ඒ විතරක් නෙවෙයි. එම ආර්ථිකයේ ප්‍රතිලාභ සමාජයේ හැම දෙනාටම සාධාරණව බෙදීයන ක්‍රමයක් හදන්නත් ඕනෑ. වංචාව, දූෂණය, නාස්තිය අහෝසි කරලා දේශපාලන සංස්කෘතියේ විශාල වෙනසක් කරන්න ඕනෑ. මිනිස්සු හිතන විදියේ පවා වෙනස්කම් කරන්න අවශ්‍යයි.

ඒ කියන්නේ අපි සරල ආණ්ඩු මාරුවක් නෙවෙයි කළ යුත්තේ. නිකං බඩු කිහිපයක මිල අඩුකිරීම වගේ දේවල් වෙනුවට ආර්ථිකයේ, සමාජයේ, ගැඹුරු පරිවර්තනයක් කළ යුතු වෙනවා. ඒ සඳහා වන දැක්ම හා වැඩපිළිවෙළ අප සතුව තිබෙනවා.

***මේ කාර්යයේදී ජනතාවට පැවරෙන කාර්යභාරයක් තියෙනවාද?***

ඔව්. අපට අවශ්‍ය ඡන්දය දීල පැත්තකට වෙලා ඉන්න ජනතාවක් නොවෙයි. ආණ්ඩුවක් හදලා ඒ ආණ්ඩුව එක්ක අත්වැල් බැඳගෙන රට හදන ජනතාවකුයි. ජනතාව අවදි කරවන්නෙ නැතිව ජනතාව මෙහෙයවා ගන්නේ නැතිව මේ ගැඹුරු වෙනස්කම් කරන්න බැහැ. ඒ නිසා ජනතා පිබිදීමක් ඇති කළ යුතු වෙනවා. ඒකට ජාතික පුනරුදයක් කිවුවත් හරි. ඒ වගේම අප ඉදිරිපිට නව නිදහස් අරගලයක් තිබෙන බව ජනතාවට තේරුම් කර දිය යුතු වෙනවා. අපේ රට දැන් තිබෙන නිවට, දීන, පසුගාමී, පරාධීන තත්වයෙන් මුදාගැනීමට එය අවශ්‍යයි.

මේක කරන්න පුළුවන් පසුගිය කාලයේ අපි සැලසුම් කළ 'ගැහැනු අපි එක මිටට' කාන්තා සමුළු මාලාවේදී අපි දැක්කා ගැහැනු මොන තරම් උනන්දුවෙන් උද්වේගයෙන් පෙරට එනවද කියල. ඒ නිසා ජනතා පිබිදීමක්, ජනතා මෙහෙයුමක් ඇති කොට රටේ පරිවර්තනයට ජනතාව දායක

> **ඉතාම කෙටියෙන් කිවුවොත් අපි නිෂ්පාදනය මත පදනම් වූ ශක්තිමත් ස්ථාවර ආර්ථිකයක් ගොඩනගන්න ඕනෑ. ඒ ආර්ථිකයට ආර්ථික බලවේග වගේම ජනතාවත් සම්බන්ධකර ගන්න ඕනෑ. ඒ කියන්නේ ජන සහභාගී ආර්ථිකයක්. ඒ විතරක් නෙවෙයි. එම ආර්ථිකයේ ප්‍රතිලාභ සමාජයේ හැම දෙනාටම සාධාරණව බෙදීයන ක්‍රමයක් හදන්නත් ඕනෑ. වංචාව, දූෂණය, නාස්තිය අහෝසි කරලා දේශපාලන සංස්කෘතියේ විශාල වෙනසක් කරන්න ඕනෑ.**

11 වැනි පිටුවට




# පරාජය කළ යුතු 'පරාජයේ වියරුව'..

ඉතිහාසයක් පුරාවට පරාජය පමණක් උරුම වූ ජනතාව වෙනදා මෙන් නොව ජයග්‍රහණය පිළිබඳ ආශ්වාදයකින් කටයුතු කරමින් සිටිති; සිය පංතියේ සමාජ ව්‍යාපාරය හා බද්ධව ක්‍රියාකාරී වෙමින් සිටිති. රට පිළිබඳ තමාටද වගකීමක් ඇති බව තේරුම් ගෙන තමාගේ සමාජ කොටස ඉටු කිරීමට වගකීම්සහගත මැදිහත්වීම් කරමින් සිටිති. රට පුරා සිදුකරන සමීක්ෂණ ප්‍රතිඵලවලින් කියාපාන්නේ එයයි. ලොව පුරා පැතිරී සිටින ශ්‍රී ලංකිකයන් බලමුළු ගැන්වෙමින් කියාපාන්නේ ඒ යට කළ නොහැකි ජයග්‍රහණයේ සත්‍යයයි.


මෙසේ ලොවක් අවදි කරමින් දළුලන ලාංකේය සමාජ ජයග්‍රහණය ධනපති පංතියට පරාජයක් ගෙනන බව එහි ප්‍රතිපක්ෂයයි. මෙනිසා ධනපති පංතිය හා ඔවුන්ගේ දේශපාලන සහචරයෝ වියරුවැටී, තම පොදු හතුරා වන ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරය වෙත, ජ.වි.පෙ. ප්‍රමුඛ ජාතික ජනබලවේගය වෙත සෑම අයුරින්ම ප්‍රහාර දියත්කරමින් සිටිති. පසුගියදා රූපවාහිනී සංවාදයක් තුළදී පිටවූයේ ඔවුන්ගේ ඒ පරාජයේ වියරු වේදනාවයි. ජ.වි.පෙ. මූලස්ථානය ඉදිපිටට එන්නේද එහිම දිගුවකි. කල්තියාම ඔවුන් විසින්ම දුප්පත් කරන ලද ගම්මානවලට කඩාවදිමින් හාල් මිටි ගණන් බෙදන්නේද, ගම්මුන්ගේ දුක්සැප බලමින් දැන් දැන් "සහන මෝඩ්" 'ඔන්' කරන් සිටින්නේද ඉදිරියට එළඹීමට නියමිත මැතිවරණයට පෙර සූදානමක් ලෙසිනි.

එසේ පාලකයා කුමන වංගුව ගැසුවද, මෙරට ජනතාව වසර 76ක ඔවුන්ගේ සිල්ලර දේශපාලන ගමනේ නිමාව දැකීමට අපේක්ෂාසහගතව සිටිති. ජනතාවගේ ඒ මතවාදීමය වෙනස හමුවේ, මතවාදී තලයේ දැවැන්ත පරාජයකට ලක්වෙමින් සිටින ධනපති පංතිය දිනෙන් දින වියරු වැටෙමින් සිටී. දිනෙන් දින මෙරට ජනතාව එක්රොක්වන සමාජ ව්‍යාපාරයට එරෙහිව ඔවුන්ට පාවිච්චි කළ හැකි එකම මතවාදී අවිය 88-89 සම්බන්ධයෙන් ඔවුන් විසින් ප්‍රබන්ධ කරන ලද කරුණු පමණි. සමාජය හමුවේ කිසිදු වලංගුතාවක් නොමැති, අසත්‍ය අවලාද මඩ ප්‍රහාර ඔවුනට අවශ්‍ය වී තිබෙන්නේ එබැවිනි.

කෙසේ නමුත් පාලක පංතියේ මේ වියරු හැසිරීම්වලින් කියාපාන්නේ අන් කිසිවක් නොව, ප්‍රායෝගිකව පරාජය වීමට ඔවුන් කෙසේවත් සූදානම් නැති වගය. මේ නිසා මැතිවරණය ආසන්න වෙත්ම මෙවැනි වියරු මැදිහත්වීම් වැඩි වනු මිසෙක මෙතනින් නැවතී යැයි කිසිසේත්ම අපේක්ෂා කළ නොහැක. සියලු මාධ්‍යයන්, නීති බලතල යොදාගනිමින් හැකි සියලු ආකාරවලින් ඔවුන් ඔවුන්ගේ බලය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් පංතියක් ලෙස එක්වෙති. එබැවින්, තත්වයන්, සිදුවීම් සියල්ල නිවැරදිව කිරාමැන බලමින්, අවබෝධ කරගනිමින්, විනිවිද දකිමින්, සියලු අභියෝග අභිමුව අප ලබමින් සිටින, අත්පත් කරගැනීමට නියමිත මැතිවරණ ජයග්‍රහණයන්, සමාජ පරිවර්තනයන් අත්පත් කරගන්නා තුරුම ආරක්ෂා කරගත යුතුය. ඒ වෙනුවෙන් වඩ වඩාත් සංවිධානය වෙමින්, ජනතාව දැනුවත් කරමින්, දැනුවත් වෙමින්, පෙළගස්වමින් අපේ වගකීම් කොටස ඉටු කළ යුතුමය.

## බලන් ජයගොස නැගෙන...

බලන් දිගු
අහස් තල
අනෝරා වැසි සේම...
සීරා මැද ගලන
රක්ත ජන ගඟ
පීරා ඇදෙන
දයාබර...
මහා ජන ප්‍රවාහය
සතුරන් කිළිපොලන
හිරිගඩු පිපී
වෛරයෙන් උමතුව,
උන්ගේ විලාපය
මරණීය...
නුඹලා
බිය විය යුතුමය
අයුක්තියට,
අසාධාරණයට,
අනීතියට එරෙහිව
නැගෙන බලයට...
නුඹලා
සසල විය යුතුමය...



# ජනපති රනිල්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ කොමිසමට පැමිණිල්ලක්



වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් තම දේශපාලන කටයුතු සඳහා ජාතික තරුණ සේවා සභාවේ තරුණ තරුණියන් හා එහි දේපළ අයථා ලෙස යොදවා ගැනීමට එරෙහිව පසුගිය අප්‍රේල් 26 දින සමාජවාදී තරුණ සංගමය විසින් 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාවට පැමිණිල්ලක් ගොනු කළේය.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු, අමාත්‍යාංශ ලේකම් ආචාර්ය කනපතිපිල්ලේ මහේසාන්, ජාතික තරුණසේවා සභාවේ සභාපති පසිඳු ගුණරත්න යන අයට විරුද්ධව මෙහි දී පැමිණිලි කළ බව සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ප්‍රකාශ කළේය.

මාර්තු 10 දින කුලියාපිටියේ එජාපය විසින් පැවැත්වූ රැලිය සඳහා ජාතික තරුණ සේවා සභාවට අයත් අංක එන්ඒ 9099, එන්බී 1389, එන්බී 3384, එන්බී 3383 දරන වාහන අයථා ලෙස යොදාගෙන ඇති අතර එහි නර්ථන කණ්ඩායමක්ද එම රැලියේ සංස්කෘතික අංගයක් ලෙස යොදාගෙන ඇති බවත් මේ වන තුරුත් ඊට අදාළ මුදල් ගෙවා නොමැති බවත් එරංග සහෝදරයා ප්‍රකාශ කළේය.

# රැකියා විරහිත උපාධාරීන්ගේ ගැටලුවට වහා විසඳුම් අවශ්‍යයි





රැකියා විරහිත උපාධිධාරී ඒකාබද්ධ මධ්‍යස්ථානය විසින් පසුගිය අප්‍රේල් 28 දින මරදාන කාලීස් නර්සිං හෝම්හිදී මාධ්‍ය හමුවක් පැවැත්විය. රැකියා විරහිත උපාධාරීන් මේ වන විට මුහුණ දී තිබෙන ගැටලු හා මේ දක්වා බලධාරීන් දැනුවත් කළද උපාධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙලක් මේ වන තෙක් සකස් කොට නැත. මේ වන විට රැකියා නොමැතිව උපාධිධාරීන් 45,000ක් පමණ සිටින බව පැවසේ. මෙහිදී රැකියා ලබා ගැනීමේ සටනේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරමින් ඔවුන් පැවසුයේ ඉදිරියේදි උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වන බවය. මෙහිදී රැකියා විරහිත උපාධිධාරී ඒකාබද්ධ මධ්‍යස්ථානයේ කැඳවුම්කරු මහේෂ් අඹේපිටිය සහෝදරයාද අදහස් දැක්විය. මේ අවස්ථාවට ජනිත් චතුරංග සහෝදරයා හා ප්‍රසාදී හැඳලගේ සහෝදරියද සහභාගි වූහ.

# මාලිමාවේ තරුණයින්ගෙන් ක්‍රිකට් තරගාවලියක්




'Youth අපි set එකම fit එකේ මාලිමාවට' එකතු වෙන්න යන මැයෙන් රට පුරා සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගො…ඩ ආසනයේ ක්‍රිකට් තරගාවලියක් සංවිධානය කරනු ලැබිණි. මෙය මාලිමාවේ අන්තර් කොට්ඨාස සභාව මගින් සංවිධානය කරන ලද අතර පසුගිය අප්‍රේල් මස 03වන දින සාර්ථකව අවසන් කෙරිණි.

## අහසේ ගැවෙන මිත්‍රත්ව මාර්ගය



පකිස්ථානය සහ චීනය සම්බන්ධ කරන කරකෝරම් අධිවේගී මාර්ගය චීන ජාතිකයන් විසින් "මිත්‍රත්ව මාර්ගය" ලෙස හඳුන්වනු ලබන අතර, මෙම අධිවේගී මාර්ගය කරකෝරම් කඳුවැටිය හරහා පකිස්ථානය හා චීනය සම්බන්ධ කරයි. මීටර් 4,964 ක උන්නතාංශයකින් ගමන් කරන එහි ඉදිකිරීම් 1959 දී ආරම්භ කළ අතර වසර 27 ක ඉදිකිරීම්වලින් පසුව නිම කරන ලදී. හිමාලය සහ හින්දුකුෂ් කඳුවැටි තුනක් හරහා කිලෝමීටර් 1300ක් දක්වා දුරක් කරකෝරම් මාර්ගය විහිදෙයි.

## අළු මතින් නැගිටින මිදි වයින්



ස්පාඤ්ඤයේ කැනරි දූපත්වල, 'ගිනිකඳු වයින්' නිපදවනු ලැබේ. ඛනිජමය පස් මත වගා කරන මිදිවලින් නිෂ්පාදනය කරන මෙම වයින් ඉතා උසස් තත්වයේ තිබෙන අතර ඉහළ වටිනාකමක් ගනී. මෙම දූපත්වල 1730 සහ 1736 අතර සිදු වූ Timanfaya ගිනි කන්ද පුපුරා යාම හේතුවෙන් මෙම ප්‍රදේශයේ ගිනිකඳු lapilli ස්ථරවලින් වැසී ඇත. පසුකාලීනව එම ගිනිකඳු අළු මත මිදි වගා කිරීම සිදු කර ඇති අතර ඉන් ඉහළ අස්වැන්නක් ලැබේ.

## ප්‍රථම වතාවට සංරක්ෂණය කෙරෙන නිල් තල්මස් හදවත



කැනඩාවේ නිව්ෆවුන්ඩ්ලන්ඩ් දූපතේ වෙරළට ඔබ්බෙන් වූ අයිස්වල සිරවී මිය ගිය නිල් තල්මසෙකු ටොරොන්ටෝහි රාජකීය ඔන්ටාරියෝ කෞතුකාගාරයේ විශේෂඥයින් විසින් සම්පූර්ණයෙන්ම සංරක්ෂණය කිරීමට ක්‍රියා කර ඇත.

මෙම නිල් තල්මසාගේ හදවත, මීටර් 1.8 (අඩි 6) කුඩා මෝටර් රථයක ප්‍රමාණයෙන් සහ කිලෝග්‍රෑම් 200 (රාත්තල් 440) බරින් යුක්ත වේ. මෙම දැවැන්ත සත්වයාට දිගින් මීටර් 30ක් (අඩි 100ක්) දක්වා වර්ධනය විය හැකිය. එබැවින් උගේ විශාල ශරීරය වටා රුධිරය ගමන් කිරීම සඳහා හෘදය ස්පන්දනයකට රුධිර ලීටර් 220ක් (ගැලුම් 58ක්) පමණ පොම්ප කරන බව මෙම විද්‍යාඥයන් විසින් සොයා ගෙන ඇත.

# හොඳින් කියවා ගත යුතු මේ මොහොතේ දේශපාලනය

මේ මොහොත වන විට ලාංකේය දේශපාලනය, පක්ෂ දේශපාලනයෙන් පංති දේශපාලනයට මාරුවෙමින් තිබේ. දේශපාලන විද්‍යා පොත්පත්වලින්, න්‍යායික සංවාදවලින් ඉගෙන ගත නොහැකි තරමේ බොහෝ අත්දැකීම් ලාංකේය දේශපාලනයේ වත්මන් මොහොත විසින් ජනතාවට උගන්වමින් තිබේ. අයෙක් මේ දේශපාලන මොහොත හොඳින්ම කියවා ගත යුත්තේ ඒ නිසාය.

ඊනියා නිදහසෙන් පසු මෙරට පාලනය කළ විශේෂයෙන් පසුගිය දශක කිහිපය තුළ මෙරට පාලනය කළ ප්‍රභූ පාලක කල්ලිවලට ඉතිහාසයේ පළමු වතාවට පරාජයේ බිය දැනී තිබේ. මීට පෙර මැතිවරණවලදී ඔවුන්ගේ කුමන හෝ පක්ෂයක් පරාජය වුවද, එය ඔවුනට ඔවුන්ගේ ප්‍රභූ ධනේශ්වර පංතියේ පරාජයක් වූයේ නැත. එකම කණ්ඩායමේ එක් පිරිසක් පරාජය වී ඔවුන්ගේම අනෙක් පිරිස ජය ගන්නා විට එය ඔවුන්ට ගැටලුවක් වූයේ නැත.

එහෙත් දැන් ලංකාවේ දේශපාලන බලය ප්‍රභූ පාලක කල්ලියක්, දූෂිත කල්ලියක් අතින් පොදු ජනයා අතට මාරුවීමේ තත්වයන් පෙළගැසී තිබේ. ජනතාවට පැරණි දේශපාලන පක්ෂ අතහැර නව දේශපාලන කඳවුරක් වෙත එනම්, ජාතික ජන බලවේගය වෙත ඇදෙමින් සිටී. මේ තත්වය පාලක කණ්ඩායම් භීතියටත්, තැතිගැන්මටත්, කෝපයටත් පත්කරනු ලැබ තිබේ.

පසුගිය දශක හතක් පමණ තිස්සේ ජනතාව රැවටීමට, බොරුවට පවත්වාගෙන ආ ඊනියා පක්ෂවල වෙනස්කම්, පොදු විරෝධයන් සියල්ල පසෙක දමා දැන් මෙතෙක් රට පාලනය කළ සියලු පක්ෂ, කල්ලි කණ්ඩායම් එක්ව මාලිමාව වටකර, පහරදීම ආරම්භ කර තිබේ.

ඔවුන් මෙලෙස කුපිත වී ඇත්තේ ඇයි? ඒ වෙන කිසිවක් නිසා නොව මෙතෙක් ඔවුන් අත තබාගෙන ආ "බලය" අහිමි වීමේ අනතුර නිසාය. සත්‍ය ලෙසම ඔවුන් දැන් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙමින් සිටී. එයට ඉතාම සාධාරණ හේතුද තිබේ. අප මේ ජීවත් වන්නේ පීඩාවටත්, රැවටීමටත් ලක්වූ පොදු ජනයාගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගිය වටපිටාවකය; පැරණි පාලනය අවසන් කිරීමට ජනතාව පෙළගැසෙන තත්වයකය.

එය එසේ වූයේ ඇයි? මෙරට පාලක කල්ලිවල වසර 76ක දේශපාලන ගමන අවසානයේ රට ආර්ථික වශයෙන් බංකොලොත්ය. කර්මාන්ත, ව්‍යාපාර, බිඳවැටී තිබේ. ණය බර, බදු බර, දරාගත නොහැකි වී තිබේ. වංචා, දූෂණ, කොල්ලකෑම්වල අවසානයක් තවමත් නොමැත. හැකි හැමදෙනාම රටහැර යන තත්වයට පත්ව සිටිති. මේ ජීවන අත්දැකීම් "වෙනස්වීමට" පොදු ජනයාට බල කළ අතර, ඔවුහු පැරණි පක්ෂ අත්හැරදමා යමින් සිටිති.

2019 දී ලක්ෂ 69ක ඡන්දය ගත්, තුනෙන් දෙකක ආණ්ඩුවක් පිහිටවූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දැන් බිඳී විසිරී ඇත. රාජපක්ෂවරුන්ගේ අනුහස් සහිත නායකත්වය අහෝසි වී ඇත. පොහොට්ටුවේ බොහෝ මැති ඇමතිවරු රාජපක්ෂවරුන් අතහැර රනිල් සමග ගනුදෙනු කරමින් සිටිති. අඩු ගණනේ පොහොට්ටුවට ජනාධිපතිවරණයේදී අපේක්ෂකයෙක්වත් නැති මට්ටමට පත්ව තිබේ.

ඒ අතර එ.ජා.ප. ය දෙකඩ වීම නිසා රනිල්ගේ පලුව කුඩා වී එය හොඳටම දුර්වල වී තිබේ. රාජපක්ෂලා විසින් ජනාධිපතිකම නොදුන්නේ නම්, මේ වන විට එ.ජා.ප.යක් නැත. එ.ජා.ප.ය කැඩුණු විට එහි ලොකු පලුව නියෝජනය කළ ස.ජ.බ.ද ජනතා විශ්වාසය දිනා ගැනීමට අසමත්ව අපේක්ෂාභංගත්වයට පත්ව සිටී. ස.ජ.බ. තුළ සිටින හර්ෂ, කබීර්, එරාන්, තලතා වැනි අය රනිල් දෙස බලා සිටිති. සජිත්ගේ නොමේරූ, ළදරු දේශපාලන හැසිරීම් ස.ජ.බ.ය තවදුරටත් අර්බුදයට යවා තිබේ.

මේ අතර ශ්‍රීල.නි.ප.ය තුළ ගෝරි ගොඩකි; නඩු පිට නඩුය. පක්ෂ කාර්යාලය සීල් තබා ඇත. පක්ෂයක් තවදුරටත් නැත. අනෙක් අතට පසුගිය කාලයේ දිනන ලොකු පක්ෂවලට හේත්තු වී තම පැවැත්ම සකසා ගත් දේශපාලනයේ පිළිල වැනි කුඩා කල්ලිද සිය පැවැත්ම අහෝසි වීමේ තර්ජනයට මුහුණ දී සිටී.

මේ සියල්ලටම මුල ජාතික ජන බලවේගයේ වර්ධනයත්, ජනතාව වේගයෙන් ඒ වෙත ආකර්ෂණය වීමත්ය. මේ නිසා දේශපාලනයෙන් අහෝසි වී යාමේ තම තමන්ගේ ඉරණමට හේතුව මාලිමාවේ වර්ධනය බව දන්නා මේ සියල්ලෝ දැන් සියලු භේද බොරු පසමිතුරුකම් පසෙකලා මාලිමාවට එරෙහිව යක්ෂාවේෂයෙන් කටයුතු කරමින් සිටිති.

"මහ ගංවතුර ආ විට නයි, මුගටි දිවි බේරා ගැනීමට එකම කොටයේ පිහිනන්නේ" යැයි අපේ කියමනක් තිබේ. ලංකාවේ වර්තමාන දේශපාලන අත්දැකීම එම කියමන සනාථ කර තිබේ. නයි-මුගටි, නයි-පොළොන්ගු, කබරු-ගුරඬි ආදීන් පමණක් නොව ගොනුස්සන්, පත්තෑයන්, ගෙම්බන් ආදී සියල්ලන්ම තම අවසන් පැවැත්ම වෙනුවෙන් එකට එක් වෙමින්ද, වෙන වෙනම සිටිමින්ද මාලිමාවට එරෙහි ප්‍රහාර අරඹා තිබේ.


ඉන් සිදුවන්නේ කුමක්ද? මෙම කල්ලි විසින් තමන් එකිනෙකාට වෙනස් යැයිද, එකිනෙකා අතර විශාල ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇතැයිද, යනුවෙන් මෙතෙක් කල් පවත්වාගෙන ආ ව්‍යාජය ජනතාවට හෙළිදරව් වීමය. තවදුරටත් එ.ජා.ප., ශ්‍රීල.නි.ප. හෝ එ.ජා.ප. පොහොට්ටු හෝ ස.ජ.බ ආදී පක්ෂවල වෙනසක් නැති බවත්, සියල්ලෝම "එක මල්ලේ ලුණු" බවත් ජනතාව ඉගෙන ගැනීමය. ඉන් සිදුවන්නේ ජනතාවට තව තවත් ඔවුන් ප්‍රතික්ෂේප කර මාලිමාව වෙත පැමිණීමය.

අනෙක් අතට මාලිමාව අරභයා මේ කිසිදු කල්ලියකට, පුද්ගලයෙකුට සාධනීය විවේචනයක් ඉදිරිපත් කිරීමටද නොහැකි වී තිබේ. ඒ වෙනුවට තම පක්ෂවල සිටිනා වාචාලයින් යොදා සිදුකරන බැන අඬගැසීම්, කැකෝ ගැසීම්, අවලාද, අසත්‍ය චෝදනා, බේගල්වලින් මාලිමාවට පහර දීමට ඔවුන්ට සිදුවී තිබේ. සංයමයක් නැති, දැනුමක් නැති, තර්කණයක් නැති වාචාලයන්ගේ කැකෝ ගැසීම් විසින් අර්බුදයට යන්නේ මාලිමාව නොව එම කණ්ඩායම්ය. ගැඹුරු, පළල් ප්‍රතිපත්තිමය සංවාද සඳහා දැන් එම පක්ෂ, කල්ලි තුළ කිසිවෙකුත් නොමැති බව ජනතාව ඉදිරියේ ඔප්පු වෙමින් තිබේ. මේ මොහොතේ දේශපාලනයේ විශේෂත්වය වන්නේ එයයි.

දැන් මහින්ද රාජපක්ෂ කණ්ඩායම පවතින්නේ රනිල්ගේ බලයේ පිහිටෙනි. අනෙක් අතට ස.ජ.බ. මන්ත්‍රීවරු වියදම් කරන්නේ රනිල් ඔවුන්ට පමණක් ලබාදෙන ප්‍රතිපාදනවලිනි. ස.ජ.බ. මන්ත්‍රීවරු හතකට රුපියල් කෝටි 400කට වැඩි මුදලක් ලබාදී ඇති බව පසුගියදා අනාවරණය විය. ස.ජ.බ. මන්ත්‍රීවරු රට සවාරි යන්නේ රනිල් සමගය. ඉදින් මේ සියල්ලෝම එකය. එකම තනයෙන් කිරි බී වැඩෙන සත්වයන්ය. ජනතාව ඉගෙන ගත යුතු පාඩම එයයි.

දේශපාලනයේ කකුළුවන් මෙන් මේ දේශපාලන කණ්ඩායම් දිය කෙළිමින් සිටියේ හැළියේ වතුර රත්වෙන තෙක්ය. හැළියේ වතුර මේ තරම් ඉක්මනින් රත්වෙනු ඇතැයි ඔවුන් නොසිතන්නට ඇත. එහෙත් දැන් වතුර රත්වෙන්නට පටන් ගෙන තිබේ. මොවුන්ගේ මේ වියරු දැඟලීම, කලබලය මේ නිසාය.

දැන් සමාජ චින්තනය ස්ථිරවම වෙනස් වී ඇත. කිසිවෙකුට එය ආපසු හැරවිය නොහැක. අලුත් වෙනසක් වෙනුවෙන් පොදු ජනයා පැරණි දේශපාලනය අත්හැර යමින් සිටී. හෙට දින නව ලොවක්, නව සමාජයක් බිහිකිරීම ස්ථිරය. පරාජයට පත්වන්නේ, බලාපොරොත්තු සුන්වූවන්ගේ, බලය අතහැරීමට කිසිදා නොසිතූ එහෙත් බලය අහිමි වෙන බව දැනෙන දේශපාලන මැරයන්ගේ, දේශපාලන තක්කඩියන්ගේ අඳෝනා, විලාප ළතෝනි හා කෙඳිරිලි තවත් ටික දවසක් ඇසෙනු ඇත. එය තේරුම් ගැනීම මේ මොහොතේ දේශපාලනයේ ජයග්‍රහණය සොයා යන අයගේ වගකීමය.




> දැන් සමාජ චින්තනය ස්ථිරවම වෙනස් වී ඇත. කිසිවෙකුට එය ආපසු හැරවිය නොහැක. අලුත් වෙනසක් වෙනුවෙන් පොදු ජනයා පැරණි දේශපාලනය අත්හැර යමින් සිටී. හෙට දින නව ලොවක්, නව සමාජයක් බිහිකිරීම ස්ථිරය.



"කර්තව්‍ය යෝජනා කිරීම පමණක් මදිය. අපි ඒවා කරගෙන යාමට ක්‍රම පිළිබඳ ප්‍රශ්නයද විසඳිය යුතුය. අප සතු කර්තව්‍යය ගංගාවක් තරණය කිරීම නම්, පාලමක් හෝ ඔරුවක් නොමැතිව එය තරණය කරන්නට අපට නොහැකිය. පාලමක් හෝ ඔරුවක් පිළිබඳ ප්‍රශ්නය නොවිසඳා ගංගාව තරණය කිරීම ගැන කරන කවර කතාවක් වුවද නිරර්ථකය. ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය විසඳන්නේ නැතිව, කර්තව්‍යය ගැන කතා කිරීම නිෂ්ඵලය."

**මාඕ සේතුං**
**උද්ධෘත පාඨ**
**පිටුව 259**

# ඉරාන අභියෝගය කාටද?




පසුගිය අප්‍රේල් 14 වන දින ඉරානය ඉතිහාසයේ ප්‍රථම වරට ඉරාන භූමියේ සිට ඊශ්‍රායලයට ඩ්‍රෝන හා මිසයිල ප්‍රහාරයක් සිදු කරන ලදී. 'සැබෑ පොරොන්දුව' ලෙස ඉරානය විසින් එම ප්‍රහාරය හඳුන්වන ලද අතර එහිදී ඉරානයේ ඉලක්කය වූයේ පලස්තීනයේ ගාසා තීරයට ගුවන් ප්‍රහාර එල්ල කිරීමට යොදා ගනු ලබන ඊශ්‍රායල යුද කඳවුරකි. එහිදී ඉරානය ඩ්‍රෝන යානා සහ මිසයිල සිය ගණනක් යොදා ගනිමින් ප්‍රහාරය එල්ල කරන ලදී. එය මේ තාක් කිසියම් රටක් විසින් එල්ල කරන ලද විශාලතම ඩ්‍රෝන ප්‍රහාරය ලෙසටද වාර්තා විය. ප්‍රහාරය සඳහා ඩ්‍රෝන යාත්‍රා 200කට වැඩි ප්‍රමාණයක් කෲස් මිසයිල් එකසිය පනහක් පමණ සහ සහාබ් මිසයිල 110 ක් පමණ ආදී වශයෙන් යොදා ගැනුණි. ඒවා ඉරානයේ සිට පමණක් නොව සිරියාව, ඉරානය, ලෙබනනය සහ යේමනය ආදී ප්‍රදේශවල සිටද එල්ල කර තිබේ.

### ආත්ම ආරක්ෂාවේ අයිතිය

ඉරානය මෙම ප්‍රහාර එල්ල කරනු ලැබුවේ මෙම වසරේ අප්‍රේල් පළමුවැනි දින ඊශ්‍රායලය විසින් සිරියාවේ දමස්කස් නුවර පිහිටි ඉරාන තානාපති කාර්යාලයට මිසයිල ප්‍රහාරයක් එල්ල කිරීමට ප්‍රතිප්‍රහාරයක් වශයෙනි. එම ප්‍රහාරයෙන් ඉරාන තානාපති කාර්යාලය මුළුමනින්ම විනාශ වූ අතර සිරියාවේ හා ලෙබනනයේ ඉරාන හමුදා මෙහෙයුම් භාර ඉරාන විප්ලවකාරී හමුදාවේ ජෙනරාල්වරු දෙදෙනෙක් ඇතුළු දාසය දෙනකු ඝාතනයට ලක් විය. එම ප්‍රහාරය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තීන් හා විශේෂයෙන් වියනා සම්මුතිය උල්ලංඝනය කිරීමකි. එසේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පහළොස්වන ප්‍රඥප්තියට අනුව ස්වෛරී රාජ්‍යයකට එවැනි සන්නද්ධ ප්‍රහාරයක් එල්ල වුවහොත් පුද්ගල හෝ සාමූහික ආත්ම ආරක්ෂාව සඳහා අයිතිය ඇති බව සඳහන් කර ඇති බැවින් ඉරානයටද ඒ නිසා ප්‍රතිප්‍රහාරය සඳහා අයිතියක් ලැබී තිබෙන තත්වයක් යටතේදීයි, මෙම ආකාරයෙන් ඉරානය ඊශ්‍රායලය වෙත ප්‍රහාර එල්ල කරන්නේ.

ප්‍රහාරය පිළිබඳ සැළවූ වහාම එක්සත් ජනපදය, ඊශ්‍රායලයේ ආරක්ෂාව වෙනුවෙන් මැදිහත් වන බවට ප්‍රකාශ කළ අතර එල්ල වූ මිසයිල හා ඩ්‍රෝන යානා විනාශ කිරීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් විය. එක්සත් ජනපදය එලෙස මැදිහත් නොවන්නට ඊශ්‍රායලයට තනිව එම මිසයිල හා ඩ්‍රෝන යානා අහසේදීම විනාශ කර දැමීමට අපහසු වීමට ඉඩ තිබුණි. බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ජර්මනිය ඇතුළු බටහිර අධිරාජ්‍යවාදී රටවල් එම ප්‍රහාරය හෙළා දකින ලදී. ප්‍රහාරය එල්ල කිරීමෙන් මිනිත්තු ගණනකට පසු ඉරානය ප්‍රකාශ කළේ එය ඊශ්‍රායලය වෙත කෙරෙන අවසන් අනතුරු ඇඟවීම බවයි. ඊශ්‍රායලය ඊට එකට එක කරන්නේ නම් වඩාත් දරුණු ප්‍රහාරයක් ඊශ්‍රායලය වෙත එල්ලවනු ඇති බවට එහිදී ඉරානය අනතුරු ඇඟවීය. මේ අතර ඉරාන විදේශ ඇමති හුසේන් අමීර් අබ්දුල්ලාහියන් ප්‍රකාශ කළේ තමන් තවදුරටත් මැදපෙරදිග කලාපය තුළ යුද උණුසුම ඇති කිරීමට කටයුතු නොකරන බවත්, නමුත් හැමවිටම තම ජාතික ආරක්ෂාව සහ ජාතික වුවමනාවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටින බවත්ය.

මේ අතර එක්සත් ජනපදය මෙම ප්‍රහාරය පදනම් කරගනිමින් ඉරානයට එරෙහිව නව සම්බාධක පැනවීමේ උත්සාහයක නිරතව සිටී. දේශපාලන විචාරකයින් පවසන්නේ එවැනි සම්බාධක පැනවීම් විසින් මැද පෙරදිග යුද උණුසුම තවත් ඉහළ දැමීමක් මිස වෙනත් යමක් සිදු නොවනු ඇති බවයි.

### ඉරාන යුද උපායමාර්ගයේ වෙනසක්

මෙම සිදුවීම ඉරානය හා ඊශ්‍රායලය අතර කලක් තිස්සේ පවතින කලාපීය බල අරගලයේම කොටසක් වන නමුත් මෙම නිශ්චිත ප්‍රහාරයට ආසන්නතම හේතුව වන්නේ පලස්තීනයේ ගාසා තීරය වෙත ඊශ්‍රායලය විසින් සිදුකෙරෙන ප්‍රහාරයයි. පලස්තීනය වෙත ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කිරීමෙන් පසුව ඉරානය, ඊශ්‍රායලය  අවට ඇති රාජ්‍යයන්ගේ සිට ක්‍රියාත්මක වන ඉරාන හිතවාදී කැරලි කණ්ඩායම් මගින් ඊශ්‍රායලය වෙතත් රතු මුහුදේ ප්‍රවාහනය කරන ඊශ්‍රායලය හා එක්සත් ජනපද යාත්‍රා වෙතත් ප්‍රහාර එල්ල කරන්නට පටන් ගත්තේය. ඒ හේතුවෙන් රතු මුහුදේ නාවික ගමනාගමනයට මුළුමනින්ම බාධා පැමිණුනු අතර පලස්තීනය වෙත එල්ල කරන ඊශ්‍රායල ප්‍රහාර කලාපීය ප්‍රශ්නයකින් ඔබ්බට වර්ධනය වී ම මුළු ලෝකයටම බලපාන ප්‍රශ්නයක් බවට පත් විය. උදාහරණයක් ලෙස ඊශ්‍රායලයේ ගාසා තීරය ආක්‍රමණය කිරීමට එරෙහිව රතු මුහුදේ නාවුක යාත්‍රාවලට හූති කැරලිකරුවන් පහරදීම හේතුවෙන්  ආසියාවේ සිට යුරෝපය දක්වා භාණ්ඩ ප්‍රවාහන වියදම් 400%කින් ඉහළ ගිය අතර ගමනාගමන කාලය දින පහළොවකින් පමණ වැඩි විය. ඊශ්‍රායලය ඉරානයේ විප්ලවකාරී හමුදාවේ නායකයින් ඉලක්ක කර ප්‍රහාර එල්ල කිරීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ එයයි.

මෙම ප්‍රහාරය ඉරානයේ යුද උපායමාර්ගික වෙනසක් සලකුණු කරන අවස්ථාවක් ලෙස නිරීක්ෂණය කළ හැකිය. මෙතෙක් ඉරානයේ ඊශ්‍රායලය සම්බන්ධ ප්‍රතිපත්තිය වූයේ ඊශ්‍රායලය සමඟ ඍජු ගැටුමකට නොගොස් 'උපායමාර්ගික ඉවසීම' මත කටයුතු කිරීමය. එහෙත් ඊශ්‍රායලය විසින් සිරියාවේ ඉරාන තානාපති කාර්යාලය වෙත ඍජු මිසයිල ප්‍රහාරයක් එල්ල කිරීම විසින් එකී සීමාවන් අභිබවා යාමට ඉරානයට බල කරනු ලැබ තිබේ. එසේම ජාත්‍යන්තර දේශපාලනය තුළ සිදුවෙමින් පවතින බල තුලනයේ වෙනස්කම්ද එවැනි ක්‍රියාමාර්ගයකට ඉරානය පෙළඹුවා වන්නට පුළුවන.

එසේම මෙම ප්‍රහාරය හරහා ඉරානය තමන් සුළුකොට තැකීමට ඉඩ නොදෙන බවත් කලාපය තුළ තම සගයන්ගේ බලාපොරොත්තු සුන් කිරීමට ඉඩ නොදෙන බවත් පෙන්වා දී තිබේ. එසේම ඉරානය කලාපය තුළ තමන්ගේ ස්ථානය අභියෝගයට ලක්කිරීමට ඉඩ නොදී ඇති අතර ලෝකවාසී මුස්ලිම්වරුන්ගේ අවධානය දිනා ගැනීමට සමත්ව සිටී. එපමණක් නොව මෙම ප්‍රහාරය මගින් ඉරානය ඊශ්‍රායලයට පමණක් නොව  සමස්ත බටහිර රටවලටම කිසියම් අභියෝගයක් ඉදිරිපත් කර තිබේ.

## **මාලදිවයින:** මුයිසු බලය තහවුරු කරගනිමින්



පසුගිය අප්‍රේල් 21 වන දින පැවති මාලදිවයිනේ පාර්ලිමේන්තු මැතිවරණයෙන් එරට ජනාධිපති මොහොමඩ් මුයිසුගේ ජනතා ජාතික කොන්ග්‍රසය ජයග්‍රහණය කර තිබේ. ජනතා ජාතික කොන්ග්‍රසයේ ආසන අනූතුනක් වන මුළු පාර්ලිමේන්තු ආසන ගණනින් හැටහයක් දිනා ගැනීමට සමත්වී තිබේ. මීට පෙර මාලදිවයිනේ පාලනය බලය හෙබවූ මාලදිවයිනේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට දිනාගත හැකි වූයේ ආසන දොළහක් පමණි. මෙම මැතිවරණ ප්‍රතිඵලය 2023 වසරේදී බලයට පත්වූ මොහොමඩ් මුයිසුගේ වැඩපිළිවෙලට ලැබුණු ජනතා අනුමැතියක් ලෙස ජාත්‍යන්තර මාධ්‍ය වර්තා කරයි.

## **ඉන්දියාව:** 543ක් තෝරන්න මිලියන 969ක් ඡන්දපොළට



ඉන්දියාවේ පාර්ලිමේන්තු මැතිවරණය අප්‍රේල් 19 වන දින ආරම්භ විය. ලෝක් සභාව හෙවත් පහළ මන්ත්‍රී මණ්ඩලය සඳහා නියෝජිතයින් පන්සිය හතළිස් තුනක් තෝරා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන මෙම මැතිවරණයක් අදියර හතකින් පැවැත්වෙන අතර එය අවසන් කරන්නේ ජූනි පළවෙනි දිනයි. සමස්ත ප්‍රතිඵලය ජූනි 04 වන දින ප්‍රකාශ කිරීමට නියමිතය. ඉන්දියාවේ මුළු ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව මිලියන 969ක් වන අතර එය එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා රුසියාවේ මුළු ජනගහනය එක්ව ගත්තද ඊටත් වඩා වැඩි සංඛ්‍යාවකි. මෙවර ඉන්දීය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වත්මන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදිගේ නායකත්වයෙන් යුතු ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය හා ඉන්දීය කොන්ග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුතු ඉන්දියානු ජාතික සංවර්ධන සන්ධානය ප්‍රධාන කණ්ඩායම් දෙක ලෙස තරග වැද සිටී.

## **එක්සත් ජනපදය:** බයිඩන් ටික්ටොක්ට එරෙහිව යුද ප්‍රකාශ කරයි




අප්‍රේල් 24 වන බදාදා එක්සත් ජනපද ජනාධිපති ජෝ, බයිඩන් චීන සමාග මක් වන ටික් ටොක් සමාජ මාධ්‍ය අඩවිය එක්කෝ එක්සත් ජනපද සමාග මකට විකිණීමට හෝ එසේ නොවන්නේ නම් එය එක්සත් ජනපදය තුළ තහනම් කිරීම සඳහා වන නීතියකට අත්සන් තබන ලදී. මෙය එක්සත් ජනපදය චීනයට එරෙහිව ගෙනයන සීතල යුද්ධයේ නවතම ක්‍රියාමාර්ගයයි. මෙම පනත සඳහා සෙනෙට් මණ්ඩලය තුළ ඡන්ද විමසීමේදී පක්ෂව ඡන්ද 78ක් සහ විරුද්ධව ඡන්ද 19ක් ලෙස ඡන්දය ප්‍රකාශ වී තිබුණි.

## **දකුණු ඇමරිකාව:** අධිරාජ්‍යවාදයට එරෙහිව ශක්තිමත් වෙමින්



අපේ ඇමරිකාව සඳහා වන බොලිවීරියානු සන්ධානයේ වෙළඳ ගිවිසුමෙහි විසිතුන්වැනි සමුළුව අප්‍රේල් 24 වන දින වෙනිසුවෙලාවේ කරකාස් නුවරදී පැවැත්විණි. එම සන්ධානයේ සාමාජික රටවල් දහයෙහි රාජ්‍ය නායකයින් සහ අමාත්‍යවරුන් ඊට සහභාගි වූ අතර විශේෂ  ආරාධිතයෙකු ලෙස හොන්ඩුරාස්හි නියෝජිතයකුද සහභාගි විය.  මෙම සන්ධානය ආරම්භ කරනු ලැබුවේ 2004 වසරේදී එවකට වෙනිසියුලාවේ ජනාධිපති හියුගෙ ා් චාවේස්  සහ කියුබානු ජනාධිපති ෆිදෙල් කස්ත්‍රෝ විසිනි. ලතින් ඇමරිකානු හා කැරිබියානු කලාපය තුළ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට එරෙහිව එකමුතුව සහ ඒකාග්‍රතාව ගොඩනැගීම අරමුණු කර ගනිමින් මෙම සන්ධානය පිහිටුවනු ලැබ ඇත.

# මැතිවරණය වෙනුවෙන් අර්බුදය කල් දමා ගැනීමේ කලාව



ලංකාව දිගුකාලීනව ආර්ථික අර්බුදයට ගොදුරුවී ඇති බව දැන් කාටත් රහසක් නොවේ. එම අර්බුදයේ තරම ගෙවීමට ඇති ණය නොගෙවීමෙන්ම පැහැදිලිය. දැන් රනිල් වික්‍රමසිංහ රාජපක්ෂ හවුල් පාලනයට අවශ්‍ය මේ අර්බුදයට දිගුකාලීන සැලසුම් සහගත උත්තරයක් නොව කෙටිකාලීන අර්බුද කල්දමා ගැනීමේ පැලැස්තරයකි. අර්බුදයද සැබැවින්ම කෙටිකාලීන පැලැස්තරවල ප්‍රතිඵලයකි. දැන් අර්බුදයට වගඋත්තරකරුවෙකු නොමැත. රනිල් අර්බුදයේ තරම පැහැදිලි කරයි. එහෙත් තමන්ට පිටින් ස්වභාවිකව පහළ වූ අර්බුදයක් ලෙස සලකයි. බාහිර ජාත්‍යන්තර බැඳුම්කර ගනුදෙනුවලින් ලංකාව ලබාගත් ඩොලර් බිලියන 17.5ක ණය තොග යෙන් බිලියන 13ක්ම ලබාගෙන ඇත්තේ 2015 - 19 රනිල් වික්‍රමසිංහ පාලනය තුළදී බව රනිල් හිතාමතාම අමතක කරයි. බැඳුම්කර අර්බුදය විසඳීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හවුල්කර ගැනීමේ තමන්ගේ දක්ෂතාවය ගැන ඔහු කයිවාරු ගසන්නේ එවැනි තත්වයක් තුළය.

ලංකාවේ ක්‍රියාත්මකවූ ධනේශ්වර ආර්ථික මොඩලය ධනවාදී පොදු ගතිලක්ෂණවලින් විතැන් කර ආර්ථිකය පාදඩකරණයට සහ දේශපාලන පාදඩකරණයටද ඇදනු ලැබිණි. රනිල් වික්‍රමසිංහ රාජපක්ෂ තනි හා හවුල් යුගවලදී බව ජනතාවට අමතක කරවන සාකච්ඡා න්‍යායද නිර්මාණය කිරීම මේ දිනවල ඔවුන්ගේ උපක්‍රමික වැඩසටහනක් බවට පත්කර ඇත.

ඒ නිසාම අර්බුදයට විසඳුම සොයන නව මාවත මෙන්ම අර්බුදයේ දිග පළලද හොඳින් තේරුම් කර ගැනීම මේ මොහොතේ අතිශය වැදගත් එහෙත් සංකීර්ණම කටයුත්තක් බවට පත්ව ඇත.

1977 සිට විවෘත ආර්ථිකය විවෘත ආර්ථිකයේ මානුෂික මුහුණුවර සුභ අනාගතය මහින්ද චින්තනය ආසියාවේ ආශ්චර්ය ආදී නොයෙක් ලේබල්වලින් නාමකරණය කරන ලද්දේ එකම ආර්ථික මොඩලයකි. සමාජ වෙළඳපොළ ආර්ථිකය ලෙස සජිත් කණ්ඩායම නාමකරණයට ලක් කිරීමට උත්සාහ කරන්නේද එම ක්‍රමයම හැර අන් යමක් නොවේ. සියලු නම් ලද ආණ්ඩු පාලනයන් තුළ සිදු කළේ රාජ්‍යයේ කාර්යභාරයේ අවම කරමින් හෝ කුඩා කරමින් නව ලිබරල් විවෘතකරණයට මාවත සකස් කිරීමය.

එහි ප්‍රතිඵල ලෙස ආර්ථිකයේ නිෂ්පාදන පංගුව දේශීය මෙන්ම විදේශීයවද හැකිළිණි. රජයේ ආදායම අඩු විය. ජාත්‍යන්තර වෙළදාමේ ලාංකේය පංගුව බිඳ වැටුණි. විදේශ වෙළඳාමේ වෙළඳ ශේෂ පරතරය දෙගුණයක් වූ අතර ගෙවුම් ශේෂ අර්බුදයක රට ගිලී ගියේය. එහි ප්‍රතිඵල ලෙස ආර්ථික ක්‍රියාවලියෙන් බැහැර කෙරුණු, පලවා හරින ලද ජනගහනයේ පංගුව වැඩි විය. රටේ ඇති නැති පරතරය උග්‍ර විය. ආදායම බෙදීයෑමේ විෂම චක්‍රයේ ගිලුණු රටක් බවට ලංකාව පත්විය.

ධනවාදී රටක වුවත් ක්‍රියාත්මක විය යුතු මූලික ආර්ථික මූලධර්ම වෙනුවට නාස්තිය දූෂණය වංචාව පගාව හා ගමේ සමුපකාර කඩේ සිට මහා පරිමාණයේ රාජ්‍ය ව්‍යවසාය දක්වා දේශපාලනීකරණය වූ ආර්ථිකයක් නිර්මාණය විය. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට ආර්ථිකය පාදඩකරණය විය. ලාංකේය ආර්ථික අර්බුදයේ ස්වභාවය ඉතා සංක්ෂිප්තව ඒ ආකාරයය.

> **දැන් විසඳුම ප්‍රවේශය විය යුත්තේ ජන සහභාගිත්වයෙන් ගිලිහුණු මේ ආර්ථිකයට යළි ජනතාව සම්බන්ධ කර ගැනීමය. ආර්ථික ක්‍රියාවලියට ජනසහභාගිත්වය ඇති කර ගැනීමට එම ජනතාවට ඒ පිළිබඳව විශ්වාසය ගොඩනැගිය යුතුය. ඒ සඳහා ආර්ථිකයේ ගිලිහුණු ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ යළි ස්ථාපිත කළ යුතුය. එසේ නොමැතිව ගජ මිතුරු කල්ලියට වාසි සලසන ආර්ථික කුමන්ත්‍රණවලින් රටක් ගොඩගත නොහැකිය.**

දැන් විසඳුම ප්‍රවේශය විය යුත්තේ ජන සහභාගිත්වයෙන් ගිලිහුණු මේ ආර්ථිකයට යළි ජනතාව සම්බන්ධ කර ගැනීමය. ආර්ථික ක්‍රියාවලියට ජනසහභාගිත්වය ඇති කර ගැනීමට එම ජනතාවට ඒ පිළිබඳව විශ්වාසය ගොඩනැගිය යුතුය. ඒ සඳහා ආර්ථිකයේ ගිලිහුණු ප්‍රජාතන්ත්‍රවාදී ගති ලක්ෂණ යළි ස්ථාපිත කළ යුතුය. එසේ නොමැතිව ගජ මිතුරු කල්ලියට වාසි සලසන ආර්ථික කුමන්ත්‍රණවලින් රටක් ගොඩගත නොහැකිය. එය රනිල්, සජිත්, රාජපක්ෂලා පිළිගන්නා ධනේශ්වර ආර්ථික උපක්‍රමයටද පටහැණිය.

## අර්බුදය කල්දැමීම

මේ වන විට ආණ්ඩුව අර්බුදය 2048 දක්වා කළමණාකරණය කර ගැනීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කැඳවාගෙන ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් යෝජනා සියල්ල ඉදිරිපත් වන්නේ "එකම සපත්තුව සෑම කකුලකටම" න්‍යායට අනුවය (one size fit for all). මේ ගතවන මොහොතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම ඍජු ලෙසම ප්‍රතික්ෂේප කිරීමට නොහැකි අර්බුද යථාර්ථයක් ඇති බව පැහැදිලිය. මීට කලින්ම රටක් ලෙස අර්බුදය කලින් දැක මූල්‍ය අරමුදලේ ප්‍රතිකාර ලබා නොගන්නා තැනට කටයුතු නොකිරීමේ වරද ඇත්තේ ජනතාව වෙත හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇඟිල්ල දිගු කිරීමෙන් හෝ දෝෂාරෝපණය කිරීමෙන් නොවේ. එය මේ රට මෙතෙක් පාලනය කළ අදූරදර්ශී පාලකයින්ගේම වරද මිස අන් යමක් නොවේ.

ආණ්ඩුව දැන් මූල්‍ය අරමුදලේ පිහිට පතා ඇත්තේ දිගුකාලීන ආර්ථික අර්බුදයට පිළියම් සෙවීමට අවශ්‍ය පසුබිම සකස් කර ගැනීමට නොව කෙටි කාලීනව මැතිවරණ ජයගැනීම වෙනුවෙන් අර්බුදය කල්දමා ගැනීම සඳහාම ඒ නිසා දැන් ආණ්ඩුව පත්ව ඇත්තේ 'මඟ හිටියොත් තෝ නසී. ගෙදර ගියොත් අඹු නසී' තත්වයටය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සාමාන්‍යයෙන් විස්තීරණ ණය පහසුකම ලබා දෙනු ලැබූ අවස්ථාවලදී අනුගමනය කර ඇත්තේ එම ණයවල පොලිය, වාරික අයකිරීම හා අයකර ගැනීමට නොහැකි නම් ණය කපා හැරීමක් (Hair Cut) යෝජනා කිරීමය. නමුත් ලංකාවට දැන් ඔවුන් යෝජනා කර ඇත්තේ අපූරු අලුත්ම ක්‍රමයකි. එය හඳුන්වන්නේ Macro Link Bond (MLB) ලෙසටය. එයට අනුව අපේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ යනවිට ඒ ඉහළ යාමේ අනුපාතිකයට ණය ගෙවිය යුතු වාරික හා පොලී ප්‍රතිශතයද ඉහළ දැමිය යුතුය. ඔවුන්ගේ ඒ ක්‍රමයේ තර්කය වන්නේ ඉදිරියට ණය ගෙවීමට කල් ගන්නා කාලයේ දළ දේශීය නිෂ්පාදනයේ ඉහළ යාමක් පමණක් බව පැහැදිලි වෙමින් තිබේ. මූල්‍ය අරමුදලේ පළමු වාරිකය ඉදිරියේ දණ ගැසුවේ පළාත් පාළන ඡන්දය කල්දමා ගැනීම සඳහාය.

දැන් ඊළඟ වාරික සඳහා ණය දෙනු ලැබූ බැඳුම්කර හිමියන් සමග සාකච්ඡා ආරම්භ කර ඇත්තේද මැතිවරණ සිතියම අනුව ණය සිතියම කල් දමා ගැනීම අරමුණු කරගෙනය. 2028 දක්වා ණය කල් දමා ගැනීමට ආණ්ඩුවට අවශ්‍යය. ණය හිමියන්ට ණය වාරික හා පොලී මිස ආණ්ඩුවේ දේශපාලන සිතියම අනුව ඇති අවශ්‍යතාවය වැදගත් නොවේ.

වන්නේ නම් එයට හේතුව ඉදිරියට එන නව පාලනයේ හෝ ජනතාවගේ කැපකිරීමවල ප්‍රතිඵලයක් නොව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය නිසා දළ දේශීය නිෂ්පාදනය වැඩිවන බවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මැදිහත්වීම ඇතිව ජාත්‍යන්තර බැඳුම්කර හිමියන්ට ණය සහනයක් හෝ කපාහැරීම යෝජිත අනික් ක්‍රමවේදය යහපත් පාලන ආකාර බැඳුම්කර (Governing method bond) ක්‍රමයයි. එයට අදාළ පාලනයේ යහපත් ක්‍රම සලකා බැඳුම්කරවලින් ගෙවිය යුතු ප්‍රමාණයන් කපා හැරීමක් හෝ කල්දීම සලකා බලයි. මේ කොයි ආකාරයෙනුත් ආණ්ඩුව අපේක්ෂා කරන්නේ ණය කල් දමා ගැනීමය.


ආණ්ඩුව උත්සාහ කරමින් ඉන්නේ එක්කෝ බලය තහවුරු කර ගැනීම නැතිනම් බලය අහිමි වන විට ඒ බලය මාරුවන කාට හෝ පාලනය පවත්වාගෙන යා නොහැකි වන ලෙස ආර්ථිකය අකර්මණ්‍ය කිරීම බව ඉතා පැහැදිලිය. ඒ නිසා අද අර්බුදය හෙටට කල් දැමීමේ න්‍යාය අනුව ඔවුහු කටයුතු කරති.

ජනාධිපති අරමුදලේ ඇති මුදල්ද යොදවමින් ආණ්ඩුවට බිලි බා ගතහැකි විපක්ෂයේ මන්ත්‍රීවරුන්ව විමධ්‍යගත ප්‍රතිපාදන වෙන්කිරීම ඉන් එක් උදාහරණයකි. හාල් මිල අඩු කිරීමට නොහැකි, උද්ධමනය පාලනය කිරීමට නොහැකි ආණ්ඩුව හාල් කිලෝ 10ක් බැගින් බෙදන්නේය. හාල් මිල, බඩු මිල ඉහළ ගොස් ඇත්තේ එක්කෝ ජනතාවගේ වරදකිනි. නැතිනම් විපක්ෂයේ වරදනි. මන්ද හාල් බෙදන්නේ ආණ්ඩුව නිසාය. මිල වැඩිවීමට වගකිව යුතු ආණ්ඩුව වගකීම ගැන වගක් නැතිවම තවත් මිල ඉහළ යාමට ඉඩ දී ඡන්ද ඉලක්ක කර බඩු බෙදීමට පටන් ගෙන ඇත.

කලින් සාකච්ඡා කළ පරිදි අර්බුදය ඇත්තේ නිෂ්පාදනය බිඳ වැටීමෙන් පටන් ගැනීමේ සිට පරිභෝජන හැකියාව ජනතාවට අහිමි කිරීම දක්වා වූ ක්‍රියාවලියක් තුළය. ආණ්ඩුව උත්තර හොයන්නේ අර්බුදයට නොව ඡන්ද සඳහාය. සාමාන්‍ය පොලී අනුපාතය 4% - 5% වන ජාත්‍යන්තර බැඳුම්කර කල්දැමූ පසු 9.75% ක පොලියකට වැඩිකර ගෙවීමට ආණ්ඩුව සූදානම්ය. ඒ එකඟතාවයට ආණ්ඩුව කැමැත්ත පළ කරන්නේ 2029දී එම පොලිය ගෙවීමට තමන් බලයේ නොසිටින බව රනිල් රාජපක්ෂලා හොඳින්ම දන්නා නිසාය.

කෙසේ වෙතත් අර්බුද ඉදිරියට තල්ලු කර එදාවේල ගත කිරීමටද සීමාවන් ඇත. මේ වනවිටත් ආණ්ඩුවේ දේශපාලන සූදුව

11 වැනි පිටුවට



"කෙනෙකුගේ මිනිස්කම පිළිබිඹු වන්නේ අන්‍යයන්ගේ මිනිස්කම ප්‍රකාශ කිරීම සඳහා ඔහු සවිඥානිකව ක්‍රියා කිරීමේ ප්‍රමාණයට අනුවය. මේ නිසා අන්‍යයන් හඳුනා ගැනීමට කටයුතු කිරීමෙන් මිනිසා අන්‍යයන්ද සමග මනුෂ්‍යත්වයේ නියම ලක්ෂණ භුක්ති විඳිනු ලබයි"

**කාල් මාක්ස්**



## "නොරැවටී සිටීමට අධිෂ්ඨානයෙන් වැඩ කරමු!"

**සමන්මලී ගුණසිංහ**
**සභාපතිනි - අයිතීන් උදෙසා කාන්තාවෝ**



වැඩ කරන සියලුම ගැහැනුන්ට හා පිරිමින්ට ඇති වැදගත්ම දිනය තමයි ජාත්‍යන්තර කම්කරු දිනය. අද අපි ජීවත් වෙන ලෝකය මෙලෙස වෙනස් වීමටත් සංවර්ධනය වීමටත් මූලිකවම හේතුව වී ඇත්තේ පාලකයින්ගේ මැදිහත්වීම නොව වැඩ කරන මිනිසුන් හා ගැහැනුන්ගේ ශ්‍රමයයි. අපේ රටේ අවුරුදු හැත්තෑ හයක් රට පාලනය කළ පාලකයෝ දුප්පත්කම වර්ධනය කිරීම, වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කිරීම, හා ගැහැනිය අවලංගු කාසියක් බව පත් කිරීම මෙන්ම ගැහැනියගේ ශ්‍රමයට වටිනාකමක් නොදීමට හැමවිටම පරිසරය සකස් කළා. අයිතිවාසිකම් අහිමි වීම වගේම දුප්පත්කම ගැහැනියගේ ඔඩොක්කුවට වැටුණ මහා ඛේදවාචකයක්. එදා දේශපාලන වශයෙන් සංවිධානය නොකළ ගැහැනිය අද අලුත් බලාපොරොත්තුවක් සහිතව දැනුවත්භාවයෙන් එක මිටකට එකතු වෙලා ඉන්නවා. එයින් භීතියට පත් පාලකයෝ ජනතාවගෙන් සොරා ගත් ධනය මාළුන්ට පොරි විසි කරනවා සේම, වීසි කරන්න පටන් අරන්. අද කෝටි ගණනට විකිණෙන දේශපාලුවෝ ජනතාවට හාල් දෙන්න පටන් අරන්. බෙදන්නේ නැවතත් ලබා ගන්නට බව ඉතිහාසයේ පාඩම්වලින් අපි ඉගෙන අවසන්. ගැහැනිය එක මිටකට එකතු වී අලුත් බලාපොරාත්තුවක් සහිතව ජීවිත ජයග්‍රහණය කිරීමට අවදි වූයේ රැවටීමට නොවෙයි. හෙට දවසේ පුරවැසි කාර්යභාරයට උරදෙන ගැහැනිය ලෙස එක මිටකට එකතු වී නොරැවටී සිටීමට අධිෂ්ඨානයෙන් වැඩ කිරීමටයි.

# නොරැවටී එක මිටට!

බෙදන්නට ගෙනා පණු කැදලි බැඳ කල් ඉකුත් වූ සහල් පසුගියදා හමුවී තිබුණි. එම සහල් උරවල කල් ඉකුත් වීමේ දිනය සඳහන් ස්ථානයේ වෙනත් දිනයක් යොදා වංචාවක්ද කර තිබූ බව අපි දුටුවෙමු. එපමණක්ද නොව මාධ්‍ය සංදර්ශන පවත්වා දිවා ආහාර වේලක් ලබාදෙන බවට පුරසාරම් දොඩා පටන් ගත් පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහනට බෙදන්නට ගෙනා සහල් ප්‍රමිතියෙන් තොර කල් ඉකුත් වූ ඒවා බව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන් විසින් සොයා ගනු ලැබීය.

මෙවැනි සිදුවීම් තුළින් ගම්‍ය වන්නේ ලංකාවේ ජනතාවට, ආහාර වේලෙන් පවා වංචා කරන ආණ්ඩුවක් තිබෙන බව පමණක් නොවේ. කලකට පෙර පෙරදිග ධාන්‍යාගාරය ලෙස ස්වයංපෝෂිත වූ ලංකාව සහනාධාර ලැබිය යුතු මට්ටමේ ජනතාවක් සහිත රටක් බවට පත්ව ඇති බවය. රටේ දරුවන් ආහාර අනාරක්ෂිතතාව හේතුවෙන් මන්දපෝෂණයෙන් පෙළෙන බවය. එසේම රටේ පුරවැසියා එවැනි තත්වයකට ඇද දැමූ පාලකයන් විසින්ම උදම් අනමින් සහනාධාර බෙදා දෙන බවද එතුළින් පාලකයා තවත් අවුරුදු කිහිපයකට තම බලය පවත්වා ගැනීම අරමුණු කරගෙන පුරවැසියා ගොනාට අන්දවමින් හිඳින බවය.

මෙවැනි තත්වයක් තුළ වඩාත් කල්පනාකාරී විය යුත්තේත්, සැලකිලිමත් විය යුත්තේත් ගැහැනුන්ය. එයට හේතුව වන්නේ රටේ ජනගහනයෙන් 52%ක් කාන්තාවන් වීම නිසා පමණක් නොවේ; ලංකාවේ ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් බහුතරයද කාන්තාවන් වීම නිසාය. එසේ නම් බලයට පත්වන කවර හෝ පාලකයෙකුට වැදගත් වන්නේ මේ බහුතර ගැහැනු ඡන්දයි. එබැවින් ගැහැනු ඡන්ද ලබා ගැනීම උදෙසා තරගයට මෙන් යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නට දේශපාලඥයන් කටයුතු කරන බව අප තරයේ මතක තබා ගත යුතු වේ.

ආසියාතික සමාජ සංස්කෘතික බැමි තුළ සිරවී හැදී වැඩුණු ලාංකේය ගැහැනුන්ගෙන් සාතිශය බහුතරය දේශපාලනය කෙරෙහි අබමල්රේණුවක තරම්වත් සංවේදී නොවූ පිරිසකි. ඔවුන් රටේ අනෙකුත් ජනතාව මෙන්ම දේශපාලනය ලෙස දුටුවේ ඡන්දය පමණකි. ඒ නිසාම තම පියාගේ, හෝ ස්වාමි පුරුෂයාගේ දේශපාලනය මත ලංකාවේ ගැහැනුන් බහුතරයකගේ දේශපාලනය තීරණය විය. එබැවින් තම නිවස තුළ හෝ බාහිර සමාජයේ සිදුවන කිසිදු සිදුවීමකට දේශපාලනය සම්බන්ධ යැයි ගැහැනු කල්පනා නොකළෝය. එය හොඳින් හඳුනාගත් දේශපාලකයෝ ගැහැනුන් රැවටිය හැකි බවත්, ගැහැනුන්ගේ දේශපාලන සවිඥානකභාවය ඉතා දුර්වල බවත් හඳුනාගෙන ඒ අනුව ගැහැනුන් ඉලක්ක කරගෙන තම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නට කටයුතු කළහ. එනිසාම ඕනෑම ජඩ වැඩක් කරන දේශපාලකයන් ඡන්ද කාලයට සිනාසී කතා කළ පමණින්, දරුවන් වඩාගත් පමණින්, ටකරං තහඩුවක්, සහනාධාර මල්ලක් ලබාදුන් පමණින් ඒ සියලු ජඩකම් අමතක කරන්නට ගැහැනුද පෙළඹුණෝය.

දැන් නැවත වටයකින් මේ රැවටීමේ හා ගොනාට ඇන්දවීමේ කාලය පැමිණ තිබේ. එය වඩාත් තීව්‍ර වූයේ "ගැහැනු අපි එක මිටට මාලිමාවට" රැලි මාලාව මගින් ජාතික ජන බලවේගය වෙත ගැහැනුන්ගේ විශ්වාසය හිමිවීමත් ඒ විශ්වාසය නව පුනරුද යුගයක් වෙත ලාංකේය සමාජය මෙහෙය වන බලවේගය බවට පත්වීමත් නොවැළැක්විය හැකි බව දුටු බැවිනි.

දැන් රනිල් සජිත් රාජපක්ෂ තුන් කට්ටුව හා ඔවුන්ගේ ගෝලබාලයෝ නොබෙදනා දෙයක් නැත. රනිල්ගේ ආණ්ඩුව රට පුරා සහනාධාර ලෙස විදේශයන්ගෙන් ලැබුණු හාල් බෙදයි. අඩුව පුරවන්නට මෙන් ස.ජ.බෙ.න් පිට්ටනි පුරා හාල් මලු බෙදයි. තැනෙක බස් බෙදිල්ලකි. තවත් තැනක smart පංති කාමරයකි. තව තැනක පාසල් උපකරණ බෙදිල්ලකි. බඩු මලු බෙදිල්ලකි. මහන මැෂින්, සෙවිලි තහඩු, වැසිකිළි පෝච්චි එකී මෙකී නොකී මේ බෙදිලි වැඩිපුරම තිබුණේ "ගැහැනු අපි එක මිටට" කාන්තා සමුළු පැවැත්වූ දිනවල වීමද විශේෂයකි. බෙදන බෙදිල්ල කෙසේද යත් ගුල්ලන් ගැසූ, පණුවන් ගහණ කුණු වූ, කල් ඉකුත් වූ දේවල් පවා දින වෙනස් කරමින් බෙදයි.

වසර ගණනක් පුරා මැතිවරණ කාලසීමාවට සහනාධාර දීම බලයේ සිටි ජනාධිපතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ උපක්‍රමයකි. එය පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභාව දක්වාම අඩු වැඩි වශයෙන් පවත්වාගෙන එනු ලැබිණි. එතනිනුදු නොනැවතී සහනාධාර ලබාදීම ඡන්ද පොරොන්දු බවට පත්විය. ඒ අනුව ජනසවිය, සමෘද්ධි, අස්වැසුම ආදී විවිධ නම්වලින් ජනතාව වෙත සොච්චමක් ලබාදෙනු දැකිය හැකිය. ඉන්පසු ජනතාව තමන්ට හිමි සහනාධාරය අහිමි වේ යැයි ඇති බිය හා වඩා වැඩි සහනාධාරයක් බලාපොරොත්තුවෙන් තම ඡන්දය පාවිච්චි කළහ. මේ සහනාධාර පෝලිම්වල වරු ගණන් හිඳිමින් එය සොච්චමක් වුවද මහා ඉහළින් සලකා තමන්ට ඊළඟ වතාවේත් සහනාධාර ගැනීම වෙනුවෙන් ඡන්දය පාවිච්චි කළේ මෙරට කාන්තාවන්ගෙන් සැලකිය යුතු පිරිසකි.

අප අනුන්ගෙන් යැපෙන්නන් බවට පත් කළේ බලයේ සිටි පාලකයන් මිස අනෙකෙකු නොවේ. රටේ කෘෂිකර්මාන්තය විනාශ කර ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වට්ටවා සහනාධාර දෙන මට්ටමට රටේ ගැහැනුන් හිඟමනට ඇද දැමුවේ රට පාලනය කළ රනිල් වික්‍රමසිංහලා, සජිත් ප්‍රේමදාසලා මහින්ද රාජපක්ෂලා ඇතුළු හොර නඩයයි. 1948න් පසු ණය බරින් මිරිකෙන රටක් බවට පත්කරන්නටත් ගත් ණය රටේ සංවර්ධනයට නොයොදවා තම තමන්ගේ මඩිය පුරවා ගන්නත් කටයුතු කළ මේ නිල් - කොළ හොර නඩය වර්තමානය වන විට නූපන් දරුවන් පවා ණයකරුවන් බවට පත්කරනු ලැබ ඇත.

## ඉදිරියට ගමන යමු, අතරමඟ නොනැවතී

මහමෙරක් තරම් වූ සුසුම් පොදි බිම තියා
හෙළූ දහඩිය කඳුළු මැදින් දහිරිය සොයා
හෙට දිනක හිරු පිපෙන අරුම දැක ගනු නියා
වැඩකරන ගැහැනු අපි එකට සටනට ගියා


දුගී බව අලෙවි කළ පෝලිමක තැවී තැවී
වසර ගණනක් පුරා අපි උන්නෙ දැවී දැවී
ටිකෙන් ටික ඒ කරුම යන විටදි ගෙවී ගෙවී
ඉදිරියට ගමන යමු අතරමඟ නොනැවතී

මාරුවෙන් මාරුවට මුසා බස් වමාරයි
ඉර හඳත් ගෙනැත් දෙන තරමට ම කුමාරයි
නොරැවටී හිඳින්නට දැන් ගැහැනු විචාරයි
අපේ දේ කොල්ලකා දැමූ සාද හමාරයි

කුණු ගොඩක් ලෙස වීසි කර හොරුන්ගේ ගැයුම්
දියෙන් කිරි වෙන්කරමු, ඉවතලා බණ කියුම්
සැක නැතුව දිනන බව තබා සතුටක් සියුම්
එක මිටට එක්වෙලා හිටියොතින් රට දිනුම්

වසර 76ක් පුරා උන් හැදූ රටක් නැත. ලාංකේය භූමියේ රිරි මාංශ උරා බොමින් දරිද්‍රතාවයෙන් පෙළෙන පුරවැසියාට ලෙවකන්නට කටුවක් විසිකර පුරවැසියාගේ ඡන්දය මංකොල්ලකෑම 2024දී අප විසින් අවසන් කළ යුතුව ඇත.

එසේ නම් එක මිටට එකතු වූ ගැහැනුන්ට පුරවැසි වගකීමක් තිබේ. ඒ දේශපාලනයේ මේ කූට උපාය මැනවින් හඳුනා ගැනීමයි. අපට අවශ්‍ය හාල් කිලෝ 10ක් නොව, හැමදාම කන්නට හාල් මිලට ගැනීමේ වත්කමක් ඇති ආර්ථිකයකි. පාසල් උපකරණ කිහිපයක් නොව, අඩු මුදලට ඒවා සපයා ගත හැකි ආර්ථිකයකි. පාසල් කිහිපයකට වැඩි පහසුකම් නොව, සෑම පාසලකටම එක හා සමාන පහසුකම් ලැබීමකි. සෙවිලි තහඩුවක්, වැසිකිළි පෝච්චියක් වෙනුවට පහසුකම් සහිත නිවසක් සාදාගත හැකි ආර්ථික හැකියාවකි. මේ සියල්ල ඉටු කර ගැනීමට නොරැවටී දේශපාලනික සවිඥානිකභාවය ඇති කර ගත යුතුය. එවිට රැවටීම හා රවටන්නා කවුදැයි තේරුම් ගැනීමට හැකියාව ලැබේ. ගෙවල් පුරවන්නට දේවල් බෙදුවත් නොරැවටී නිවැරදි ලෙස ඡන්දය භාවිත කළ හැකි වන්නේ එවිටය. 2024 ලාංකේය දේශපාලනයේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කරන වසරක් වනු නො අනුමානය. ඒ අතගසන්නට "ගැහැනු අපි නොරැවටී එක මිටට" සිටිය යුතුමය.



"ස්වාධීන පැවැත්මක් මනසට නැති බවත් එය හුදෙක් ජලය මතුපිට වැටුණු සූර්යාගේ රශ්මි මාලාව බවත් අපි සොයා ගත්තෙමු. එහෙයින් මාගේ පුද්ගලවාදය සැබැවින්ම මායාවකි. මම මහා සමස්තයේ කොටසක්මි. මට කිසිදාක එයින් ගැලවී යා නොහැකිය. එහෙත් මට මගේ සබඳතා ප්‍රතික්ෂේප කොට බිඳ දමා, කැබිලිත්තක් බවට පත්විය හැකිය. එවිට මම කාලකණ්ණි මුස්පේන්තුවෙක්මි."

**ඩී.එච්. ලොරන්ස්**

**ඉංග්‍රීසි නවකතාකරු**

**1885-1930**

# යශෝධරාව හා කුණ්ඩලකේසිය

මේ මැයි මාසයයි. මැයි මාසය යනු දින 31 කින් සමන්විත ග්‍රෙගෝරියානු දින දර්ශනයේ පස්වන මාසයයි. එය උතුරු අර්ධගෝලයේ වසන්ත හා ගිම්හානය අතර සංක්‍රමණික මාසය වන අතර දකුණු අර්ධගෝලයේ සරත් සෘතුවේ සිට ශීත කාලය දක්වා සංක්‍රමණය සනිටුහන් කරයි.

මැයි මාසය යනු මැයි මල් පිපෙන මාසය ලෙසට අපි හඳුනාගෙන සිටිමු. අප කුඩා කල සිට වටහාගෙන සිටින්නේ මැයි මාසයට ඒ නම ලැබුණේ මැයි මල හේතුවෙන් බවයි. අසූව දශකයේ පාසල් ගිය අප අතර අතිශය ජනප්‍රිය ගීතයක් වූ, අජන්තා රණසිංහ රචනා කර, මිල්රෝයි ධර්මරත්නගේ සංගීතයට, මිල්ටන් මල්ලවආරච්චිගේ හඬින් ගැයෙන "මේ මැයි ගහ යට" ගීතය ඇසෙනවිටම අපට මතක් වන්නේ මැයි මාසයයි.

අන්තර්ජාලය පිරික්සන විට හමු වූ තොරතුරුවලට අනුව මැයි මස සඳහා නම ලැබී ඇත්තේ සශ්‍රීකත්වය හා වසන්ත කාලය සම්බන්ධ ග්‍රීක දෙවඟන වන ඒස්ගේ නම අනුවය. පුරාණ රෝම යුගයේදී, මැයි මාසය ඒස් දේවතාවියට මෙන්ම මල් සහ මල් සංකේතවත් කරන ෆ්ලෝරා දේවතාවියට කැප කරන ලද බවට තොරතුරු ඇත. මේ දෙවන පැහැදිලි කිරීම අනුව, මැයි මාසය මල් හා සම්බන්ධ වන බව පෙනී යයි. ලෝකය පුරාම මැයි මාසය සුන්දර මාසයක් ලෙස අර්ථ ගැන්වී ඇත. එය බෙහෙවින් නිවාඩු ලැබෙන මාසයයි. විවිධ සංස්කෘතීන් තුළ මේ මස කේන්ද්‍ර කර ගනිමින් විවිධ උත්සව පැවැත්වෙන අතර ඉන් ලෝක කම්කරු දිනය හෙවත් මැයි දිනය අතිශය ප්‍රසිද්ධය. එය කම්හල් හිමි ධනපතියන්නේ පැය 8 ක වැඩමුරයක් ඉල්ලා අරගලයක් කළ දිනයයි; කම්කරුවන් රැසක් ඝාතනය කරමින් ලේ විලක් බවට හැරවූ දිනයයි; ඒ කම්කරුවන්ගේ ලෙයින් තෙත් වූ කොඩියේ රත් පැහැය මැයි දිනයට ලැබුණු දිනයයි. එමෙන්ම, ස්වභාවධර්මයට අනුවද මැයි මාසය යනු බොහෝ මල් පිපෙන මාසයයි. ලෝක පුරාම සශ්‍රීක, උණුසුම් හා හරිතවර්ණ මාසය වන මැයි මාසයේ පොදු මිනිස් ලක්ෂණය සතුට හා සොම්නසයි. එය ජීව ශක්තියෙන් මෙන්ම පුනර්ජීවනයෙන් පිරුණු මාසයක් ලෙස පෙන්වා දීම නිවැරදිය.

## ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා

මැයි මාසය යනු බෞද්ධයාට ඉතා වැදගත්ම මාසයයි. ඒ මැයි මාසය, වෙසක් මාසය ලෙස හැඳින්වෙන බැවිනි. මේ මාසයේ මට සිහිපත් වන එක්තරා ස්ත්‍රියක් ගැන සඳහන් කරනු කැමැත්තෙමි. ඒ යශෝධරාවයි.

සාමාන්‍යයෙන් මැයි මස සිහිපත් විය යුත්තේ සිදුහත් කුමරා හෝ බුදුරජානන්වහන්සේ වුවත් මට සිහිපත්වන්නේ යශෝධරාවයි. ඇය ඇත්ත වශයෙන්ම සිහිපත් විය යුත්තේ සිදුහත් කුමරා විසින් ඇය හා රාහුල කුමරු මාලිගයේ තනිකර දමා බුදු බව පතා අභිනිෂ්ක්‍රමණය කළ ඇසළ මාසයේ වුවද මට ඇය ගැන වෙසක් මාසයේදී සිහිපත් වේ. මේ සිහිපත්වීම කෙරෙහි සුනිල් සරත් පෙරේරා විසින් රචනා කර, ගුණදාස කපුගේ විසින් සංගීතවත් කර ගයන "පසක් කොට ඇති සසර දුක් ගිනි" ගීතය ඉවහල් වූ බව මෙහිලා සඳහන් කරමි. ඒ ගීතය ශ්‍රවණය වෙද්දී මා සිත තුළ මැවෙන්නේ, සිය සැමියාගේ දසුනෙන්, ආදරයෙන් හා ඇසුරෙන් වියෝව, සුරතල් සිඟිති දරුවෙකුත් සමග තනිව ඈත මෑත බලමින් කඳුළු සලන යශෝධරාවගේ රූපයයි. මෙය කිසිම සම්බන්ධයක් නැති දෙයක් බවට යමෙකුට තර්ක කළ හැකිය. එහෙත්, නිර්මාණයක් රස විඳීමේදී මැවෙන චිත්ත රූප සම්බන්ධයෙන් කෙනෙකුට තවකෙකු ප්‍රශ්න කළ නොහැකිය. එබැවින්, ඉහත ගීතය ඇසෙද්දී යශෝධරාව සිහිපත්වන්නේ මන්ද යන ප්‍රශ්නයට පිළිතුරු දීමට මම කාලය වැය නොකරමි. එහෙත් කිව යුතු යමක් ඇත. මට සිහිපත් වන්නේ සම්භාව්‍ය සාහිත්‍යයේ හමුවන ගරු ගාම්භීර යශෝධරා නොව, ජන සාහිත්‍යයේ හමුවන සිංහල, ගැමි ගැහැනියකට වර නැගූ යශෝධරා කෙනෙකි.



බෞද්ධ සාහිත්‍යයේ සම්භාව්‍ය පොත පත ඇසුරින් උගත් අප දන්නා යශෝධරාව, දැඩි ගැහැනියක වූවාය. ඇය සිය සැමියා දළ අහර ගන්නා බව අසා එවැනි අහර ගත්තාය. ඔහු දිනකට එක් වේලක් පමණක් වළඳන බව දැන එක් වේලක් පමණක් ආහාර ගත්තාය. සැමියා දළ රෙදි දවටන බව අසා පට පිළි අත් හැරියාය. බුදු බව ලැබ මාලිගයට ආ දින, තමා කෙරෙහි ආදරයක් වේ නම්, බුදුන් තම කුටියට වඩිනු ඇතැයි මුරණ්ඩුවම සිටියාය.

එහෙත්, ජන කවියා මේ යශෝධරා ප්‍රතිනිර්මාණය කරන ලදී. විශේෂයෙන්ම යශෝධරාවතේ එන ගැහැනිය කිසිසේත්ම, සම්භාව්‍ය සාහිත්‍යයේ එන ගැහැනියට සමාන නැත. ඇය නොකියා නොසිටියාය. මන්ද, ඇය විසින් පෝෂණය කළ යුතු, හැර දමා ගිය සිදුහත් හා තමා යන දෙදෙනාගේම දරුවා කිරි දී පෝෂණය කරන වගකීම ඇය මත පැවරී තිබුණු බැවිනි. ඒ වෙනුවට ඇය මෙවැනි ප්‍රාර්ථනයක් කළාය.

*කැලේ තියෙන කොයි දේ වත් රස වේවා*

*මලේ බඹරු මෙන් පිරිවර ඇති වේවා*

*අව්වේ තියෙන රැස් මාලා අඩු වේවා*

*ගව්වෙන් ගව්ව දිව මාලිග සෑදේවා*

සිය සැමියාට, තමාට මෙන් මාලිගයේ රස බොජුන් නැති බව දැන ඈ ප්‍රාර්ථනා කරන්නී කැලේ තියෙන යමක් වේද, ඒ සියල්ල රසවත් වීමටයි. සැමියා හුදකලාව සිටින බව දන්නා ඇය පතන්නී මලේ බඹරු තරමට පිරිවර ඇතිවීමටයි. ඔහුගේ සත්‍යය සොයා ගැනීම වැනි මහාබ්‍යානයේ දේ ඇයට ගෝචර නැත. සත්‍යය සෙවීමට නම් හුදකලා විය යුතු බවට හැඟීමක් ඇයට නැත. ඒ වෙනුවට ඇය පතන්නී පිරිවර නිරන්තරයෙන්ම ඔහු වටා සිටින්නටය. අව් රශ්මිය අඩු වෙන්න පතන ඇය, යන යන තැන ඔහුට දිව්‍ය මාලිගා බිහි වෙන්න ප්‍රාර්ථනා කරයි. මෙහි එන අන් කවක (88 වැනි කව) ඇය සිය හැඟීම සරල ගැහැනියකගේ වෙස් ගෙන මෙසේ පළ කරයි.

*කාරණාව බුදු වෙනවා ලකුණු දැනේ*

*නෑර කැටිව ආවා මම සරණ ගෙනේ*

*භාවනාව තොර නොකරමි සිතින් අනේ*

*මාලිගාව අද අඳුරැයි ස්වාමිනේ*

යශෝධරාවතේ පද අතරින් මා දකින්නේ සිංහල ගැහැනියගේ අචල හා අනෝමය වූ ගුණයයි. ඇය අතිශය ආදරණීයය. සැමියා කෙරෙහි ලැදිය. ඔහු කෙරෙහි නිතර අවධානයෙන් සිටින්නීය. සැමියාගෙන් තමා රිදවන යමක් සිදු වුවද, එය තමාගේ වරදකින් සිදුවූවක් සේ දකින්නීය. එමෙන්ම, සැමියාගේ කවර හැසිරීමකට වුවද සමාව දෙන්නීය. යශෝදරාවතේ යශෝදරාවගේ චරිතය එවැන්නකි.

## මන්න පාර හතක් දීපු කුණ්ඩලකේසී

මේ සියල්ල සිදුවන්නේ එක් තීරණාත්මක අවස්ථාවක් දක්වා පමණි. එය ඉක්මවා ගිය විගස මෙකී යශෝධරාවම, කුණ්ඩලකේසිය බවට පත්වන්නීය.

කුණ්ඩලකේසී කතාවස්තුවේ ප්‍රධාන චරිතය ඇයයි. සද්ධර්ම රත්නාවලියේ එන මෙම කතාවෙන්, සොරෙකුට පෙම් කළ ගැහැනියක් ගැන කියවේ. ඇය සිටු දියණියකි. රූමත්ය. දිනක් ඇය සී මැඳුරු කවුළුව සමීපයේ සිටියේදී, බරපතළ වරදකට දඬුවම් පමුණුවා, වද මල් මාලා පළඳවා, වධක බෙර හඬවමින්, හිස ගසා මරා දැමීමට රැගෙන යන සොරෙකු දුටුවාය. මේ පෙරහැර දුටු ඇය සිත් ගත්තේ එහි සිටි රාජ පුරුෂයන් හෝ නිලලත් මිනිසුන් නොව, ආරෝහ පරිණාහ, පාංශු දේහධාරී, ශක්තිමත්, එහෙත් මරණයට කැපවුණු සොරාය. ගැහැනු සිත කොතරම් ගුඪදැයි සද්ධර්මරත්නාවලිය ලියූ ධර්මසේන හිමියන් අපට අවධාරණය කරයි.

"මරන්ට ගෙන යන තැනැත්තවුන් දැක උන් කෙරෙහි ඇලුම් ඇති නියාවත් උන් ලදොත් මුත් නො ලදොත් ජීවත්වීම නැති නියාවත්" දෙමාපියන්ට පවසන ඇය සොරා නිදහස කර තමාට පාවා දෙන්නැයි මාපියන්ට ඇවිටිලි කරයි. සිටුවරයා සිය දියණිය ගැන මැනවින් දන්නා බැවින්, අසීමිතව ධනය වියදම් කර, රාජපුරුෂයන්ට අල්ලස් දී සොරා නිදහස් කරගෙන සිය දියණියට පාවා දෙයි.

තමා පතන සැමියා ලැබීමෙන් අතිශය ප්‍රීතියට පත්වන කුණ්ඩලකේසිය, ඔහු කෙරෙහි දැඩි ආදරයෙන්, ආව තේව කරමින් කල් ගත කරයි. එහෙත් හොරාට එවැනි ජීවිතයක් අවශ්‍ය නොවීය. සැප විඳිමින් ගෙවන සිරගත වූ ජීවිතයට වඩා අවදානම දරමින් ගෙවන නිදහස් ජීවිතයට ඔහු කැමැති වෙයි. ඒ සඳහා උපායකින් කුණ්ඩලකේසිය කඳු මුදුනකට රැගෙන යන ඔහු ඇය ඉන් පහළට පෙරළා දමා මරන්නට සැලසුම් කරයි.

මෙම කතාව පදනම් කරගෙන ගුණසේන ගලප්පත්ති නිෂ්පාදනය කළ කුණ්ඩලකේසී නාට්‍යයට, මහගම සේකර විසින් ලියූ ඉතා මනරම් ගීතයක් ඇත. එම ගීතය ගයන්නේ ඔවුන් දෙදෙනා ව්‍යාජ පූජාවක් සඳහා කඳු තරණය කරන අවස්ථාවේදීය. "අන්න බලන් සඳ රන් තැටියෙන්" නම් ජනප්‍රිය ගීයයි ඒ.

කඳු මුදුනට ළඟාවන සොරා සිය අභිප්‍රායය කුමාරියට නොවළහා හෙළි කරයි. සිය ජීවිතය අවසානය කරා ළඟා වී ඇති බව තීරණාත්මකව වටහා ගන්නා කුණ්ඩලකේසිය, උපක්‍රමයකින් සොරා කඳු හිසින් පෙරළා ඝාතනය කර සිය දිවි රැක ගැනීමට සමත් වේ.

මෙහිදී අප වටහා ගත යුතු කරුණ වන්නේ ලාංකේය සමාජයේ ගැහැනිය සත්‍යය පසක් කළ පසු කොතරම් ඥානාන්විතද, උපායශීලීද යන්නයි. තමා රවටනු ලැබූවන්ට කොතරම් භයානකව ප්‍රතිචාර දැක්විය හැකිද යන්නයි.

මේ කතාවස්තුව පදනම් කරගෙන රුවන් බන්දුජීව කවියා 2012 වසරේ සිය කුණ්ඩලකේසී නම් කවිය ලියා ඇත. දුෂ්කර ජීවිතයක් ගත කරද්දීත් සිය සැමියාගේ සියලු අකටයුතුකම් ඉවසන ගැහැනියක්, ඔහු සිය සීමාව ඉක්මවා ගිය විගස දෙවරක් නොසිතා ගන්නා තීරණාත්මක ක්‍රියාවක් ගැන මේ කවියෙන් අප වෙත අත්දැකීමක් ලබා දෙයි.

කවියා

11 වැනි පිටුවට

# පො ලිටිකල් පංතිය

පොලිටික්ක හොඳටම පරක්කු වෙච්ච දවසක උදේ ළමයි කම්මැලිකම යන්න අලුත් සෙල්ලමක් ගැන කතා වුණා. කතා කරගෙන යනකොට එක එක යෝජනා ආවා.

"අපි අප්ඩේට් කෝච්චියක් යං" මංජුව තනියම ගිහිල්ලත් පෙන්නුව.

"අපේ කෝච්චි අප්ඩේට් නෑ. තාම පරක්කුයි" කනිය බාල්දියක් පෙරළුව.

"කෝච්චි නං අපි පොඩි කාලෙත් ගියානෙ" වසන්තියත් නෙගෙට්ව් ගත්ත.

"මේක අප්ඩේට් කෝච්චියක්. කාලීන සෙල්ලමක්. අප්ඩේට් ඉලෙක්ෂන් වර්ෂන් එක" මංජුව රහ කරල කියනකොට කට්ටිය උනන්දු වුණා.

"ඉලෙක්ෂන් කෝච්චියක්නං ඡන්දෙ ඉවර වුණාම නවත්තල දායි" කනිය කිවුවෙ සාමාන්‍යයෙන් වෙන දේ.

"නැහැ... මේක කණ්ඩායම් හැදිල කෝච්චි යන වැඩක්. නායකයො එන්ජින් වගේ ඉන්නවා. අනිත් අය පෙට්ටි වගේ ඉස්සරහ එක්කෙනාට අත් තියාගෙන එකතු වෙනවා. ඊට පස්සෙ යන එකයි තියෙන්නෙ" මංජුව සැලසුම එළනව.

"හරි මම රනිල්... කවුද මගෙ කෝච්චියට ගොඩවෙන්නෙ" කනිය හැමෝටම ඉස්සර වුණා.

"ඕක නං දුවන එකක් නෙමෙයි. පරණ යකඩවලට කඩන්න රත්මලානෙ යන එකක්" කවුරු හරි කියපු කතාවකට කට්ටියට හිනා පැන්න.

"මම සජිත්. මගෙ කෝච්චියට ගොඩවෙන අය එන්න" චමියත් ඉස්සරහට ආවා.

"හරි... පස්වැනි වේදිකාවේ ඇති මේ එංජිම අනුර. නොනැවතී දුර යන අය ගොඩවෙන්න" සමන කිවුවෙ ස්ටේෂන් නිවේදනයක් වගේ.

"අපි මේකෙ... අපි මේකෙ... අපි දුර යන අය" කට්ටිය හැමෝම වගේ සමන පිටිපස්සෙ හිට ගත්ත.

"මෙහෙම කරන්න බෑ... බෙදිලා අනිත් එංජින්වලටත් එකතු වෙන්න" මංජුව වැඩේට සාධරණයක් කරන්න බැලුව.

"අනේ අපිට විලි ලැජ්ජයි ඕවට ගොඩවෙන්න" අනුරුද්දිය ආපහු හැරිලත් නැවතුණා.

"එහෙම හිතන්න එපා... එන්න. මේක සෙල්ලමටනෙ" චමිය පින්සෙණ්ඩු වෙනව.

"මම නං රෙඩි" කනිය මොකද්ද කොලේක ලියල සපත්තු ලේස් එකකින් බෙල්ලෙ එල්ල ගත්ත.

"රනිල්ට ඉඩ දෙන්න" කට්ටියට දැක්ක ගමන් හිනා. "පීජ්... පීජ්..." ගාගෙන "රනිල්ට ඉඩ දෙන්න" කියාගෙන කනිය දෙන්නෙක් අමුණාගෙන පංතිය පුරා යන්න ගත්ත.

"බලන් ඉඳල තේරුමක් නෑ. මාත් පිටත් වෙනවා. මම තමයි හොඳටම එළවන්නෙ" චිමියත් තුන් දෙනක් අමුණාගෙන යන්න පිටත් වුණා.


"ඔය දෙන්නෙක් එක්ක කෝච්චි දෙකකට තෙල් පුච්චන එකේ තේරුමක් නෑ. වෙනම ගියාට දෙකම එකයි. එකම පීල්ල" සමන හරිබරි ගැහෙන ගමන් කිවුව.

"නෑ නෑ... මෙයලා කෝච්චි දෙකක්" ගැඹුරු හඬකින් ඇහෙනකොට තමයි ළමයි දන්නෙ පොලිටික්ක දොර ගාව ඉඳගෙන බලන් ඉන්නව.

"කෝච්චි දෙකක් කියල කියනව නමට... සර්" සමන හැරිලා පිටිපස්සෙම පෙට්ටියෙන් යන්න සංඥාව ඉල්ලුව. "බොරුවට දෙකක් වගේ පෙන්නුවට දෙන්නගෙම දේශපාලන සංස්කෘතිය එකයි. දූෂණ වංචාවලට කප්පිත්තො. ආර්ථික ප්‍රතිපත්තිය එකයි. රනිල්ගෙ යහපාලන ආර්ථික ඔස්තාද්ල දැන් ඉන්නෙ සජිත් එක්ක. හෙට අනිද්දා ආපහු රනිල් එක්ක වෙන්න පුළුවන්. ඉන්න කට්ටියත් එකයි. රනිල්ගෙ ආණ්ඩුවෙ හිටපු ෆුට් නෝට් කල්ලියම තමයි. අදත් රනිල්ම තමයි එයාල ගැන බලන්නෙ. සල්ලි දෙන්නෙත් එයාම තමයි. දැන් ඔය කාටවත් වෙනම විමධ්‍යගත සල්ලි වෙනම දෙන්නෙ නෑ... දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුටවෙන් තීරණය කරනවා කියලනෙ රනිල් කිවුවෙ. ඕත් 'දැනට සජබෙ' හත්දෙනෙකුට කෝටි 45ක් වෙනම දීල... දැන් මහ ලේකම්ටම බාර් ලයිෂන් සන්තෝෂම් දුන්නට පස්සෙ වෙන මොන කතාද?" සමනගෙ කෝච්චිය හිමිහිට ගමන පටන් ගන්නකොට පංතිය පුරා දුවපු එංජින් දෙක නැවතිලා හති හලනව.

කවුළුව හැර තබමි

# වචනවලට වඩා බලවත් නිහඬතාවය



ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ දෙවෙනි ජාත්‍යන්තරයේ පළමු සමුළුව 1889 පැරිස් නුවරදී පවත්වන්නට යෙදුණේය. එහිදී සමුළු න්‍යාය පත්‍රයේ මුල්ම කරුණ වූයේ 1886 මැයි අරගලය 1890 මැයි 01 වැනිදා සිට ජාත්‍යන්තර කම්කරු දිනය වශයෙන් සැමරිය යුතුය යන යෝජනාව සම්මත කර ගැනීමය. ඒ අනුව අප මෙවර සමරණු ලබන්නේ 134 වැනි මැයි දිනයයි.

1893 පැවති 02වැනි ජාත්‍යන්තරයේ 03 වැනි සමුළුවේදී මැයි දිනය පැය 08ක වැඩ දිනයක් සඳහා පමණක් නොව සමාජ පරිවර්තනයක් සඳහා වූ උද්ඝෝෂණ දිනයක් බවට පුළුල් කිරීමටද තීරණය කරනු ලැබීය. එවන් නව සමාජ පරිවර්තනයක මුවදොර අභියස සිටින අප විශේෂයෙන් අපේ රටේ කම්කරු පංති ව්‍යාපාරය මෙම ඉදිරි දැක්ම තම සටන්වලදී කොතෙක් දුරට අවබෝධ කරගෙන, අවශෝෂණය කරගෙන ඇත්දැයි නැවත නැවතත් සිතා බැලිය යුතුය.

ඉහත සමුළුවේදී ඓතිහාසික කථාවක් කළ එංගල්ස් දැන් කම්කරු පංතිය තම ආර්ථික තත්වය උසස් කර ගැනීමට පමණක් නොව තමන් පාලක පංතිය ලෙස සංවිධානය වීමට හා උසස් වීමටද පෙරට ආ යුතු යැයි අවධාරණය කළේය.

1886 චිකාගෝ අරගලයට නායකත්වය දුන් ඔගස්ටස් ස්පයිස් 1887 නොවැම්බර් 11දා අධිකරණ තීන්දුව අනුව මරා දැමීමට මොහොතකට පෙර මෙසේ ප්‍රකාශ කර සිටියේය.

"අපේ වචනවල වඩා අපේ නිහඬතාවය බලගතු වන කාලයක් වැඩිකල් නොගොස්ම උදාවෙනවා"

අප ප්‍රාර්ථනා කරන ඒ සොඳුරු සමාජය නිර්මාණය වනතුරු එම අභීත හඬ ලෝතලයේ දුක්විඳින වැඩකරන ජනතාව වෙනුවෙන් රැව්පිළිරැව් දෙනු ඇත.

# 1965 මැයි 14



එය ලාංකේය සමාජයේ ඝන වූ සියල්ල වාෂ්ප වූ දිනයයි. එතෙක් ශුද්ධ වූ, පාරිශුද්ධත්වයට පත් කර තිබූ ව්‍යාජයන් සියල්ල කෙළෙසා දැමූ දිනයයි. ප්‍රභූවරුන් වටා විහිදුණු රශ්මි කදම්භයන් නිවී මැකී ගිය දිනයයි. පංතියට නියම ලෙසම වූ පක්ෂය ගොඩනැගූ දිනයයි. එනම් ජනතා විමුක්ති පෙරමුණේ උපත සිදුවූ ඓතිහාසික දිනයයි.

එතෙක් ආධිපත්‍යය දැරූ සහ අධිපති මතවාදයෙන් සියලු ප්‍රගතිශීලී මත යටකරගෙන සිටි මෙරට ධනේශ්වර පංති පාලනය හා වට ගණනාවක් දූෂිතව තිබූ පැරණි වාම ව්‍යාපාරය යන බලකණු දෙකම යෝධ දේශපාලනික අර්ථයකින් වඩාත් නිවැරදිව කිවහොත් සැබෑ නිර්ධන පංති විප්ලවීය දේශපාලන අර්ථයකින් ප්‍රශ්න කළේ ජනතා විමුක්ති පෙරමුණේ උපත විසින් බව කිසිවෙකුටත් සැඟවිය නොහැකි කරුණකි.

අලුත් වෙමින්, වෙනස් වෙමින් යන ලෝකයේ ඊට සමගාමීව තත්වයන් නිවැරදි ලෙස තක්සේරු කරමින් නව මානයන්, නව උපාය උපක්‍රම සමග නවීකාරක වාම ව්‍යාපාරයක් දේශපාලනය කළ යුත්තේ කෙසේද යන්න අභ්‍යාස කිරීමට මෙරට බිහිවූ දියුණුම වාම පක්ෂ පාසලද වන්නේ ජනතා විමුක්ති පෙරමුණ බව පැවසීම අතිශයෝක්තියෙක් නොවේ. නිතරම හාස්කම් තුළින් තම ගැලවීම අපේක්ෂා කළ දුර්වලයන් බහුතරයක් නිර්මාණය වී සිටි රටක් ඒ පැරණි අධිපති භූතාත්මවලින් ගලවා දෙපයින් සිටවීමට පෙරමග ගත්තේද ජනතා විමුක්ති පෙරමුණය.

අතපසුවීම්, පසුබට වීම් හා වැරදිවලින්ද ඓතිහාසික පාඩම් ඉගෙන ගත් ජනතා විමුක්ති පෙරමුණ අද නව පන්නයේ වාම පුනරුද ව්‍යාපාරයක් ලෙස බලමුළු ගැන්වී ඇත. එය ලාංකේය බහුජනතාවගේ විශිෂ්ටම සහ නිර්මාණශීලීම පක්ෂය පමණක් නොව වඩ වඩා විශ්වාසය දිනාගෙන සිටින පක්ෂය ලෙස ඉදිරිය කරා යමින් සිටී. ඒ, අඩුපාඩු නිවැරදි කර ගනිමින් හා ඒ අනුව ගොඩනැගුණු නිර්මාණශීලී මිනිසුන්ගේ දායකත්වයන් නිසා බවද සටහන් කර තැබිය යුතුමය.

# නිරුවතට වඩා කැත වූ මුනිවත



රාජපක්ෂලාගේ පතිත දේශපාලන සංස්කෘතියෙන් පෝෂණය වූ මිනිස්සු කිනම් වර්ගයේ සත්ව කොට්ඨාසයක්ද යන්න වඩාත්ම හොඳින් වටහා ගන්නට අවස්ථාවක් පසුගියදා ශ්‍රී ලංකාවාසීන්ට උාවිය. මෙරට මෙන්ම විදෙස්ගත ජනතාවටද ලෝවැසි ජනයාටද එය දැකගත හැකි වූ අපූලත්වයෙන් අපූරු වූ දසුනක්ම විය.

දේශපාලන බලය අමනයන් අතට පත්වූ කළ රටකට විය හැකි වින්නැහිය කියාපාන හොඳම උදාහරණයකි එම අවස්ථාව.

පසුගිය දා හිරු නාලිකාවේ, 'බලය" දේශපාලන සංවාද වැඩසටහනේදී මෙරට ජනතාවට ධාරාවන් කිහිපයකම යථාව තේරුම් ගැනීමට අවස්ථාව විවර විය. එනම් රාජපක්ෂලාගේ දේශපාලන සංස්කෘතියේ නිරුවත, ප්‍රධාන විපක්ෂය යැයි කියන සමගි ජන බලවේගයේ නිරුවත සහ සැඟවූ න්‍යාය පත්‍ර සහිත සමහර මාධ්‍යවල නිරුවත ඒ අතර ප්‍රධාන වේ.

මෙහිදී පොහොට්ටුවේ සත්වයන් දෙදෙනාගේ ගති ස්වභාවය පැහැදිලි විය. ඒ ගැන කථා කිරීමටවත් දෙයක් නැත. එහිදී වඩාත්ම කුහක සහගත සහ තුච්ඡ දේශපාලන භාවිතයක යෙදුණේ සමගි ජන බලවේගයේ නියෝජිතයාය. පොහොට්ටුවේ ඩබල යක්ෂාවේශයෙන් දඟලද්දීත් අඩුම තරමේ මෙය දේශපාලන සංවාදයක් බැවින් පාදඩ අන්තයකට මෙය ගෙන නොයන්නැයි කීමට තරම්වත් සදාචාරයක් සමගි ජන බලවේග නියෝජිතයා පෙන්වූයේ නැත. සමස්තය කිරා මැන බැලූ විට අපට පැවසීමට හැක්කේ පොහොට්ටු පැටවුන්ගේ අජූත හැසිරීමටත් වඩා සිය ගුණයකින් අර සමගි ජන බලවේගය නියෝජිතයාගේ මුනිවත අපුල බවය. එම විවාදයේදී පොහොට්ටුවේ දෙදෙනාට වඩා අපි නම් දැක්කේ සමගි ජන බලවේගයේ තාපසයාගේ නිරුවතයි.

## මාලිමාව සිටින්නේ...

02 පිටුවෙන්

වෙනස් කරනවා.

විදේශ විනිමය ඉපයිය හැකි නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගිය යුතුයි. එය ආණ්ඩුවකට තනිවම කළ නොහැකියි. පෞද්ගලික අංශයත්, ජනතාවත් සම්බන්ධ කරගෙන නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනගා එහි ප්‍රතිලාභ සාධාරණ ලෙස ජනතාවට බෙදාහැරිය යුතුයි. අපේ අරමුණ ව්‍යාපාර පවරා ගැනීම නොව පවතින ව්‍යාපාර ශක්තිමත් කර ජාතික ආර්ථිකය ගොඩගැනීමයි. අපට ආර්ථිකයක් අවශ්‍ය වන්නේ ජනතාවට සතුටින් ජීවත් විය හැකි ජීවන තත්ත්වයක් ගොඩනගා ගැනීමට. මේ සමාජ බේදවාචකය වෙනස් කරන ගැඹුරු පරිවර්තනයකට අවශ්‍ය ජාතික පුනරුදයකට මුළු රටම පෙළගස්වන්න ඕනෑ. මැයි දිනයට ජනතාව මේ ආවා වාගේ රට ගොඩනැගීමටත් පෙළගස්වන්න ඕනෑ.

මේ අවුරුද්දේ මැතිවරණ දෙකක් පැවැත්වෙන්න නියමිතයි. ඔක්තෝබර් මාසයේ පැවැත්වෙන ජනාධිපතිවරණයෙන් මාලිමාවේ ජයග්‍රහණය වළක්වන්න කිසිම ජගතෙක් නැහැ. ඉතිහාසයේ පළමුවැනි වතාවට අපට" සහෝදරයා" කියන්න පුළුවන් කෙනෙක් පත් කර ගැනීමේ අවස්ථාව උදා වී තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ හොරු රැළ පලවාහැර මහජනතාවගේ නියෝජිතයන් පත් කරගෙන



රට ගොඩනගන වැඩේට සුදුසු පාර්ලිමේන්තුවක් පත් කර ගන්නවා. අපි හොඳ මිනිසුන්ගෙන් පාර්ලිමේන්තුව පුරවන්න ලෑස්තියි. රට ගොඩනැගිය හැකි ශක්තිමත් ආණ්ඩුවක් හදන්න අපි ලෑස්තියි. රට ගොඩනගමින්, අපි කාටත් සතුටින් ජීවත් විය හැකි රට ගොඩනැගීමේ ගැඹුරු පණිවුඩය මේ මැයි දිනයේදී අපි ලබා දෙනවා. ජයග්‍රහණ වෙනුවෙන් වෙහෙස වෙන්න ඕනෑ. සටන් වදින්න ඕනෑ. අපට එකතු කළ හැකි සියලු බලවේග එකතු කරන්න ඕනෑ. වැට්ටු කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන්, වෘත්තීයවේදීන්, කාන්තාවන්, ශිෂ්‍යයන් හැම දෙනාම එකමිටට එකතු කර කිසි දිනක පරාජය කළ නොහැකි ආපසු හැරවිය නොහැකි දැවැන්ත බලයක් ගමින් ගම අපි ගොඩනගමු.

රත්න ශ්‍රී විජේසිංහයන් ලියූ කවියකින් අපි සමුගන්නවා.

"ඉතින් යහළුවනි, මල් පිපුණොත් ගසක
සැකක් නැතිය එලයක් හට ගනු නිසැක
සිතින් අත නැර මල්වල මුදු මෙලෙක
වරෙව් පරාගණයට රොදබැඳ හනික"

## රටේ පරිවර්තනයට...

03 පිටුවෙන්

කරගැනීමට අපි සූදානම්. ඒ සඳහා අපි සියලු ජනයාට ආරාධනා කරනවා.

අපේ රටේ ජනතාව දැන් අසමගි කරලා තියෙන්නේ. එහෙම තත්වයක් තුළ මේ කාර්යය කරගන්න පුළුවන්ද?

ඇත්ත. පසුගිය කාලය පුරා මේ රට පාලනය කළ අය අපේ රටේ ජනතාව බෙදුවා; වෛරය වැපුරුවා. සිංහල, දෙමළ, මුස්ලිම් ලෙස, ආගම් ලෙස බෙදල සැක ඇති කළා. බලය සඳහා පාස්කු ප්‍රහාර වැනි අමානුෂික සිදුවීම් පවා නිර්මාණය කළා. ජාතිවාදී, ආගම්වාදී ගැටුම් හැදුවා. ඒත් ඒ බොහෝ දේ දැන් හෙළිදරව් වෙලා තියෙනව. ජනතාව ඉන් ඉගෙන ගෙන තියෙනවා. ඒ නිසා පාලක කල්ලිවලට දැන් ජාතිවාදය, ආගමික අන්තවාදය ඇවිස්සීම තරමක් දුෂ්කරයි.

අනෙක් අතට මේ සියලු ජනයා සමගි කිරීමේ, ජාතික ඒකාග්‍රතාවය නිර්මාණය කිරීමේ, ශ්‍රී ලාංකේය ජාතිය සැබෑ ලෙසම නිර්මාණය කිරීමේ වගකීම අපට තියෙනවා. අපි ඒක කරන්න සූදානම්. අපේ රටේ ආර්ථිකය තුළ, සමාජ ජීවිතය තුළ හැමදෙනාටම සමාන අවස්ථා නිර්මාණය විය යුතුයි. ආර්ථිකය තුළ මෙන්ම සමාජය තුළ සාධාරණත්වය ඇති කළ යුතුයි. නීතියේ විධානය, විනය රට තුළ ස්ථාපිත කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදය එහි සැබෑ අර්ථයෙන් ක්‍රියාවට නැගිය යුතුයි. ඒ පිළිබඳ අපට දැක්මක් තියෙනවා. මේවා සරල නැහැ තමයි. ඒත් මේ දේ කළ හැකියි කියන විශ්වාසය අපට තියෙනවා.

***අවසාන වශයෙන් යමක් එකතු කළහොත්?***

අපේ රටේ වසර 76ක් පැවති දේශපාලනය දැන් අවසන්. එම වසර 76 පුරා විශේෂයෙන් පසුගිය අවුරුදු 45ක් පුරා රට මේ විනාශය වෙත ඇදගෙන ආ සම්ප්‍රදායික, ප්‍රභූ, වලව්කාර පක්ෂ දැන් යල්පැන ගිහින්. ඔවුන් පසුපස ගිය කුඩා කල්ලි අහෝසි වෙළා. අද එජාපය මිය ගිහින්. ශ්‍රීලනිපයට නඩු පිට නඩු. ඇතුළේ අර්බුද. පොහොට්ටුව අනාථ වෙළා. අලුත් වගේ පෙන්නන්න හැදුවට සජබෙ කියන්නේ එජාපයේ ලොකු පලුව. ඔවුන් අලුත් නැහැ. පසුගිය ඉතිහාසය පුරා රට පාලනයට දායක වූ අය. වංචා, දූෂණ පිළිබඳ චෝදනා තිබෙන අය.

ඒ නිසා තවදුරටත් ඔවුන් පසුපස යෑම අර්ථ විරහිතයි. අපි ජනතාවට කියන්නේ රටේ අලුත් දේශපාලන තත්වයක් මතුවෙලා ජනතාවට දිනන්න අවස්ථාව ඇවිල්ලා. මාලිමාව දැවැන්ත ජනතා බලයක් බවට පත්වෙලා. ඒ නිසා පැරණි දේශපාලන කණ්ඩායම් පිළිබඳ විශ්වාසය නොතබා නැගී එන නව ජනතා බලවේගය සමග අත්වැල් බැඳගැනීමයි කළ යුත්තේ. රට වනසපු අයම, ආර්ථිකය බංකොලොත් කළ අයම රට හදනවායයි සිතීම මුලාවක්. ඒ නිසා සියලුම දෙනා හට සමාජ පරිවර්තනයක් වෙනුවෙන් සතුටින් ගෞරවයෙන්, ආදරයෙන්, සමගියෙන් ජීවත් විය හැකි රටක් ගොඩ නැගීමට අප සමග එකුවෙන්න කියල අපි හැමදෙනාටම ආරාධනා කරනවා.

## මැතිවරණය වෙනුවෙන්...

07 පිටුවෙන්

ජනතාව තේරුම් ගනිමින් සිටී. විශේෂයෙන් වැට් බදු, උපයන විට ගෙවීම වැනි බදු පිට බදුවලින් පීඩාවට පත් ජනතාව තවදුරටත් රනිල්ට හෝ රාජපක්ෂලාට ඉඩ දීමට සූදානම් නැත. රනිල්ගේම පලුවක් වන සජිත්ද විකල්ප විසඳුමක් නොවන බව ජනතාව තේරුම් ගෙන ඇති බව මැයි දිනයේ පැවැති ජන පෙළගැස්ම විසින්ම ඔප්පු කරනු ලැබීය. ඒ නිසාම මේ ගතවන දින පැය අර්බුදයේ පැය මෙන්ම විකල්ප විසඳුම් පාලනයක් සඳහා ජනතාව පෙළගැසෙන හෝරාවන් බව පසක් කර හමාරය.

## යශෝධරාව...

09 පිටුවෙන්



සිය කවිය ආරම්භයේ දීම එකී ගැහැනිය ගැන මනා චිත්‍රයක් අප හමුවේ තබයි. ඇය, නාගරික පැල්පත් හෙවත් මුඩුක්කු නිවාසවල වාසය කරන දැඩි ගැහැනියකි. මෙහිදී බන්දුජීව යොදා ගන්නා බස් වහර මඟින් ඇය අප හමුවේ පෙනී සිටින්නට සලස්වා ඇත.

***කෙස්ස උස්කරන් බැඳගෙන - රෙද්ද තදකරන් ඇඳගෙන***
***රතු පුනීල මල් පෙති බිම අතුරපු දේවී***

ඇය නීති විරෝධී මත්පැන් වෙළඳාම් කරන දැඩි ගැහැනියකි. අනතුරුව ඇය විසින් කළ කිසියම් සාහසික ක්‍රියාවක් ගැන කවියා අපගේ අවධානය යොමු කරවයි.

***සත්තුක නිදි ඇඳ වටේට - තුන් වටයක් පැදකුණු කර***
***මන්න පාර හතක් දීපු කුණ්ඩලකේසී***

ඇය සිය සැමියා ඝාතනය කර ඇත. අනතුරුව එළඹෙන පද්‍යයෙන් කවියා අප හමුවට සත්තුක කැඳවාගෙන එයි. ඔහු නීති විරෝධී ජාවාරම් කරමින් ජීවත් වන්නෙකි. මිනිසුන්ගේ මාල කඩයි. මිනිසුන්ට කංසා විකුණයි. ඒ හේතුවෙන් පොලිසිය නිතර නිතර ඔවුන් වෙසෙන පැලට පැමිණෙයි. සත්තුක නිතර නිතර හිරේ යයි. එසේ ඔහු සිරබත් කන හැම අවස්ථාවකම, ඔහු අත් නොහැර රැක බලා ගත්තේ ඇයයි. ඇය ඔහු සනසා සතපවයි.

***බතක් මාළුවක් බැඳගෙන - පියාඹා ගිහින් වැලිකඩ***
***කසෙන් තැලුම් කෑ සත්තුක සනසපු දේවී***

ජාවාරම්වලට අනතුරුව, ගැහැනියක් සිය සැමියා කෙරෙහි නොඉවසන තවත් අවකල් ක්‍රියාවන්ද සත්තුක කරයි. ඔහු සූදු කෙළියි. ලිංගික ශ්‍රමික ගැහැනුන් කරා යයි. එහෙත් ඇය ඒ සියල්ල ඉවසාගෙන සිටියාය. එහෙත් එක් දිනක්, සත්තුක සිය සීමාව පැන ඇති බව දියණියගේ විලාපයෙන් ඇය දැන ගනියි.

***"එපා තාත්තේ!" කිය කිය - දූ හීනෙන් හඬන හඬින්***
***තිගැස්සිලා නිදි පැදුරෙන් විසි වුනු දේවී***

ඒ වදනින් සියල්ල වටහා ගන්නා ඇය, දෙවරක් නොසිතා සත්තුකට ලැබිය යුතු දඬුවම ලෙස ඇයට වැටහෙන දඬුවම දීමට පසු බසින්නේ නැත.

***සත්තුක නිදි ඇඳ වටේට - තුන් වටයක් පැදකුණු කර***
***මන්න පාර හතක් දීපු කුණ්ඩලකේසී***

### විශ්වාසය පාවාදීමෙන් පසු

ලාංකේය ගැහැනිය සිය සැමියා හෝ ආදරය කරන පිරිමියා කෙරෙහි වන ලිහිල් බව නැති කර ගන්නේ ඉතාමත් තීරණාත්මක අවස්ථාවක පමණි. ඒ දරුවන්ගේ රැකවරණය සම්බන්ධ කාරණයේදීය. බොහෝ ලාංකේය දේශපාලකයින් අවබෝධ කර නොගත් කරුණක් වන්නේද එයයි. 1994 සිට මෙරට බලයට පැමිණි සෑම නායකයෙකුම බලයට පත් කිරීමේ ගාමක බලවේගය වූයේ ගැහැනියයි. 1994 වසරේ දී එක්සත් ජාතික පක්ෂයේ ජේ. ආර්. ජයවර්ධන හා ආර්. ප්‍රේමදාසගේ මිනීමරු පාලනය අවසන් කිරීමේ දී, ඔවුන් විසින් ඝතනය කළ දරුවන්ගේ මව්වරුන්ගේ පිබිදීම හේතු විය. එදා මෙදා තුර, අද වන තෙක් මහජන ඡන්දයෙන් ජනාධිපතිවරයෙක් නිර්මාණය කර ගැනීමට එක්සත් ජාතික පක්ෂයට නොහැකි වීම පිටුපස එක්තරා දුරකට දරුවන් මරා දැමූ මව්වරුන්ගේ ශාපය ක්‍රියාත්මක වූ බව අපට සිතේ. ශාපය යනු කිසියම් අදෘෂ්‍යමාන බලයක් නොව, මිනිසුන් සමූහයකගේ සචේතනික ක්‍රියාවන්ය. 1994 වසරේ චන්ද්‍රිකා බලයට පැමිණීමට, සූරියකන්ද සමූහ මිනීවල මෙන්ම අතුරුදන් වූ මව්වරුන්ගේ බලපෑම සුවිශාල විය. අනතුරුව මහින්ද බලයට ගෙන ආවේද යුද්ධය හේතුවෙන් සිය දරුවන් අනාරක්ෂිත බවට හැඟීමක් මව්වරුන් තුළ ඇති වීම හේතුවෙනි. එකී අනාරක්ෂිතභාවය අවසන් කළ අප්පච්චී කෙනෙකුට ඔවුහු සිය කැමැත්ත පළ කළහ. ඒ අප්පච්චීම, රටේ මව්වරුන්ගේ දරුවන් වෙනුවට තමාගේ දරුවන්ගේ අනාගතය, ආරක්ෂාව, රැකවරණය ගැන පමණක් සිතීමේ ප්‍රතිඵලයක් ලෙස 2015 දී පරාජයට පත් කරන ලදී. අනතුරුව ජාතික ආරක්ෂාවට මුවා වී ගෝඨාභය රාජපක්ෂ විසින් කොල්ල කන ලද්දේද මේ ලාංකේය ගැහැනියගේ මාතෘමය හැඟීමයි.

මේ වන විට මෙරට ගැහැනිය එක් වැදගත් සත්‍යයක් පසක් කරගෙන ඇත. එනම්, සිය දරුවන්ට අනාගතයක් නිර්මාණය කර ගැනීමට නම් තමා කුණ්ඩලකේසියක්සේ නැගී සිට සකල විධ හොර නඩය ගිරි හිසෙන් පහළට හෙළා දැමිය යුතු බවයි. පෙර මැයි මාසවලදී මෙන් නොව, මේ මැයි මස මා සිත තුළ මැවෙන්නේ එවන් වූ වෙනස්ම කුණ්ඩකේසියන් පිළිබඳවය.

ඔවුන් කුණ්ඩලකේසියන් පමණක්ද? යශෝධරාවන් නොවන්නේද? මගේ අදහස නම්, යශෝදරාවන් තුළ සිටි කුණ්ඩලකේසිය අවදි වූයේ නැත. හේතුව, ඇගේ ස්වාමියා වූ සිදුහත් කුමරු ඇගේ විශ්වාසය පාවා නොදීමයි. ඒ වෙනුවට ඔහු සකල ලෝක වාසීන්ගේ හිත සුව පිණිස කටයුතු කරන ලදී. මට අනුව නම්, යශෝදරා හා කුණ්ඩලකේසිය යනු දෙදෙනෙක් නොව, එක් අයෙකුමය. විශ්වසනීය වූ යශෝදරා තුළ වූ විශ්වාසය පාවාදී, අහිමි කිරීමෙන් පසු, කඳු හිස දී ඔබට හමුවන්නේ යශෝධරාව නොව කුණ්ඩලකේසීය.

ලාංකාවේ සාම්ප්‍රදායික ජඩ දේශපාලකයෝ මේ වන විට එකී යශෝධරා, කුණ්ඩලකේසියන්ට අභිමුඛව පර්වත හිස මතට වී චාටු බස් කියමින් සිටිති. ඔවුන් කඳු හිසින් බිමට පතිත වීම සම්බන්ධයෙන් ඇත්තේ කාලය සම්බන්ධ කාරණාවක් පමණමය.

## මෙවර මැයි දිනය...

12 පිටුවෙන්

ශක්තියත්, අලුතින් එක් වන අයගේ ශක්තියත් නිසයි අද ජයග්‍රහණය පේන තෙක් මානයට ඇවිත් තිබෙන්නේ. මේ රටේ ආර්ථිකයට පණපොවන ගැහැනු අපි අතුරින් ඉතිහාසයේ පළමු වතාවට මැයි රැලියකට සහභාගී වන අයත් මෙතැන ඉන්නවා. වතුකරයේ, ඇඟලුම් කර්මාන්තයේ වාගේම විදේශගතව වැඩ කරන ගැහැනුන් මේ රටේ ආර්ථික කොඳුනාරටිය ශක්තිමත් කරමින්, මේ මැයි රැලියට සහභාගී වෙනවා. ඒ වාගේම වැටුප් නොලබා ගෘහණියන් ලෙස වැඩ කරන අයත්, වෙනත් විවිධ ක්ෂේත්‍රවල වැඩ කරන අයත් වැනි විවිධ ක්ෂේත්‍රවල ගැහැනුන් අපි එක් වී සිටින්නේ අපේ දේශපාලනික කාර්යභාරය ඉටු කරන්නයි. මේ රටේ කොඳුනාරටිය ගැහැනු අපි බව හොඳින් මතක තබා ගන්න ඕනෑ. ලෝකයටම ආදර්ශයක් දෙමින්, මේ රට වෙනස් කරන බලවේගයේ සම කොටස්කරුවන් ලෙස අපි එකමිටට බැඳීසිටිනවා.

ආණ්ඩුවක් මාරු කරනවා වෙනුවට බැරෑරුම් පරිවර්තනයක් කරන්න පෙළගැසී ඇති බව අප සියලු දෙනාම දන්නවා. ඒ වෙනුවෙන් අලුතින් ඉගෙන ගන්න, අධ්‍යයනය කරන්න, මතුපිටින් නොව ගැඹුරින් කල්පනා කරන්න සියලු දෙනාම පෙළැඹී සිටිනවා. ඒ වෙනුවෙන් විනයක් සහිත සංවිධානාත්මක වටාපිටාවක් ගොඩනගාගෙන තිබෙනවා. මෙතැන තිබෙන ආදරය, සතුට, ආස්වාදය, මේ පත්තරය වෙන කොහේවත් නැහැ. එය කිසිවකුට කොපි කරන්න හෝ පරාජය කරන්න බැරි බව අපි ඔවුන්ට මතක් කර දෙනවා. සාධාරණ, යුක්තිගරුක, පොහොසත්, ආදරයෙන් පිරුණු රටක් වෙනුවෙන් ඉදිරි මාස කිහිපය පුරා අධිෂ්ඨානයෙන් ජයග්‍රහණය කරා පියනැඟීමට සියලු දෙනාට ශක්තිය, ධෛර්යය ලැබේවා.

## ජීවිතයේ සැබෑ...

12 පිටුවෙන්

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවකට දෙමළ භාෂාවෙන් රෙජිස්ටර් ලියුමක් යැවීමට නොහැකිවීමේ වේදනාවක් අපත් සමඟ බෙදා ගත්තා. ඒ ඊනියා ප්‍රභූ පාලකයන් නැවත වරක් මේ රටේ ජනතාව බෙදන්න ක්‍රියා කරමින් සිටිනවා. ඒ වාගේම වැඩ කරන ජනතාව බෙදා වෙන් කිරීමටත් කටයුතු කරමින් සිටිනවා.

අපේ ජීවිතයේ සැබෑ අර්ථය සොයන පුනරුද ගමනට තවත් ශක්තිය එක් කරමින්, දිනෙන් දින වැඩෙන අධිෂ්ඨානයෙන් මීළඟ මැයි දිනය අපේ පාලනයක් යටතේ පැවැත්වීමේ ඓතිහාසික කටයුත්තට හැම දෙනාම එකාවන්ව එකතු වෙමු.

## ජනතාව එකහඬින්...

12 පිටුවෙන්

නිසා ද? රනිල් වික්‍රමසිංහ මේ මොන මොනවා කළත්, පලවාහැරිය යුතු පාලකයකු බවට පත්වී අවසන්. ජනතාව රවටමින්, හාල් බෙදුවාට, ඉඩම් ඔප්පු බෙදුවාට නැවත නොරැවටෙන බව ජනතාව ශපථ කර අවසන්. ජාතික ජන බලවේගය වටා ජනතාව ඒකරාශී වී සිටීමෙන් රනිල් වික්‍රමසිංහලා භය වී සිටින තරමයි, ඔය පෙන්වන්නේ. අද එක් කළා වාගේම තව තවත් ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් ඒකරාශී කරමින්, මේ රටේ ජනතාවාදී පාලනයක් ගොඩනගන්න එකා මෙන් රොදබඳිමු.

වසර 76ක් පුරා රට බංකොළොත් කළ සියලුම පාලකයන් එළැඹෙන ජනාධිපතිවරණයේ දී පන්නා දැමීමේ අවස්ථාව අපට ඇවිත් තිබෙනවා. රටත්, ජනතාවත් පුනරුද යුගයකට ගෙන යන අවධියක නායකත්වය දීමේ ජන බලය විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ ලෝකවාසී ජනතාවත් සමඟ ඒකාත්මික වීමෙන් අපිත් සමරනවා. මැයි දිනය සැමරීමේ සදාචාරාත්මක අයිතියක් තිබෙන වැඩ කරන ජනතාව, ගොවි, ධීවර ඇතුළු සියලුම ජනතාවට අර්ථවත් දැක්මක් සහිතව සැමරීමේ අවස්ථාව ලබා දී තිබෙන්නේ ජාතික ජන බලවේගය පමණයි. රට දිනවන විසඳුම ගෙන එන මැයි රැලියෙන් නව ශක්තියක්, ධෛර්යයක් ලබාගෙන රට ගොඩනැගීමට පෙළගැසෙමු.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# මෙවර මැයි දිනය ඓතිහාසික පරිවර්තනයක තීරණාත්මක දිනයක්




වත්මන් පාලකයන් පලවාහරින ශක්තිමත්ම බලවේගය ගොඩනැඟීමේ කොටස්කරුවන් ලක්ෂ ගණනින් මැයි රැලියේදී දැකිය හැකි බවත් ඔවුන් ජන බලයෙන් ආණ්ඩුවක් පිහිටුවාගෙන ඉතිහාසය වෙනස් කරන පරිවර්තනයේ කොටස්කරුවන් වී සිටින බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය, එහි නායකත්වය දරන්නේ පොදු ජනතාව බවත් එම ඓතිහාසික පරිවර්තනයේ තීරණාත්මක දිනයක් ලෙස මෙවර මැයි දිනය ඉතිහාසයට එකතු වන බවත් ප්‍රකාශ කළාය.

හරිනි අමරසූරිය සහෝදරිය මෙම අදහස් පළ කළේ පසුගිය මැයි දිනය වෙනුවෙන් මාතර වෙරළ උද්‍යානයේ පැවති ජාතික ජන බලවේගයේ දැවැන්ත ජන රැලිය අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේද පැවසුවාය.

හේතු ගණනාවක් නිසා ඓතිහාසික, සුවිශේෂී රැලියක් බවට මෙය පත් වෙනවා. පසුගිය කාලයේ මැයි රැලි පවත්වා, අරගල ගණනාවක් සිදු කර, පුරවැසි අරගලයකට පසුව අත්දැකීම් එකතු කරගෙන අනාගතය දෙස ඉතාමත් අධිෂ්ඨානයෙන්, අරමුණුසහගතවයි අප මෙතැනට එක්වී සිටින්නේ. මේ රටට, සමාජයට පරිවර්තනීය මොහොතක් හැදෙන මේ රට ගොඩනැඟීමත්, වෙනස් කිරීමත් වෙනුවෙන් අපි හැම දෙනාම එකතු වී සිටිනවා. සාමූහික හැඟීමෙන්, හෘදය සාක්ෂිය හොඳටම අවදි වී තියුණු වුණු ජන බලයක් මෙතැන එකතු වී සිටිනවා. මේ දවස ඉතිහාසයේ අලුතින් ලියන පෙරළිකාරී අරගලකරුවන් පිරිසක් මෙතැනට එකතු වී සිටිනවා. වෛද්‍යවරුන්, හෙදියන්, නීතිඥයන්, ඉංජිනේරුවන්, ගොවීන්, ධීවරයන්, කම්කරුවන් සහ වැටුප් ලබන මෙන්ම නොලබන අප සියලුම දෙනා මේ රටේ පුළුල්ම ජන බලය වෙනුවෙන් එකතු වී සිටිනවා. ජීවිතයේ පළමුවරට මැයි රැලියකට එකතු වුණු අය රට වෙනස් කිරීමේ ජන බලය වෙනුවෙන් මෙතැනට එක්කාසු වී සිටිනවා.



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය

ඒ වාගේම අවුරුදු ගණනාවක් සටන් කළ, අරගල කළ, ගුටිබැට ප්‍රහාරයන්ට ලක් වූ අප්‍රමාණ පරාජයන් අත්විඳි, ඇති තරම් බැණුම් ඇසූ, සමාජයේ විහිළුවලට ලක් වුණු එහෙත්, තම දේශපාලන අරමුණ අත්නොහැර අධිෂ්ඨානශීලීව සියලු පරාජයන් දරාගෙන ජයග්‍රාහී මොහොත දක්වා අධිෂ්ඨානශීලීව සිටි පිරිසක් මෙතැන ඉන්නවා. ඔවුන්ගේ 11 වැනි පිටුවට

# ජීවිතයේ සැබෑ අර්ථය සොයන පුනරුද ගමනක් වෙනුවෙන් අපි මුලපුරා තිබෙනවා

මනුෂ්‍ය ජීවිතය යනු ශ්‍රමය වගුරා, මුදල් උපයා ගැනීම පමණක් නොවන බවත් දියුණු සංස්කෘතික ජීවිතයක් භුක්ති විඳීමත් මිනිසුන්ට අයිති බවත් අපට නොලැබුණු මනුෂ්‍ය ජීවිතයේ සැබෑ අර්ථය සොයන පුනරුද ගමනක් වෙනුවෙන් ජාතික ජන බලවේගය මුලපුරා ඇති බව කියා සිටියේය.

මහාචාර්ය ලියනගේ අමරකීර්ති මහතා




පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික මහාචාර්ය ලියනගේ අමරකීර්ති මහතා මේ දක්වා මේ බව පැවසුවේ පසුගිය මැයි 01වැනි දින අනුරාධපුරයේ සල්ගාදු ක්‍රීඩාංගණයේ පැවති මාලිමාවේ මැයි රැලිය අමතමිනි. එහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් ඔහු මෙසේද පැවසීය.

මේ මැයි රැලිය අවසන් කර අපි ආපසු යන්නේ ඊළඟ මැයි රැලිය අපේ පාලනයක් යටතේ පවත්වන බවට හදවතේ සටහන් කරගෙනයි. ඒ වාගේම මම නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ උඩපේරාදෙණිය ප්‍රදේශයේ ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරී සහෝදරවරුන් මේ ගමන සූදානම් කිරීම පිළිබඳ අත්දැකීමක් ඔබත් එක්ක බෙදා ගන්න කැමැතියි. ආධාර පත්‍රයක් රැගෙන ගෙයින් ගෙට ගොස් ජනතාව එකතු කරන අතර, ආධාරයකුත් ලබාගෙන අනුරාධපුරයට පැමිණෙන ගමනේ දී වේල් තුනක ආහාර සපයා ගැනීම ගැනත් කතා කළා. ඒ ආහාර වේල් තුළ පවා සහෝදරත්වයේ පිවිතුරු හැඟීම් සහ මානවීයත්වය, සමානාත්මතාව සටහන් වී තිබුණා. පසුගිය වසර කිහිපය තුළ ජාතික ජන බලවේගය ගොඩනැඟීමේදී මෙන්න මේ පිවිතුරු හදවත්, මිහිරි ජීවිතයක් පිළිබඳ රහස් එකිනෙකා අතර බෙදා ගැනීම මූලික වී තිබෙනවා. ඒ අතර ලැබුණු තවත් අත්දැකීමක් වන්නේ පොහොට්ටුවේ රැස්වීමට යන අය වෙනුවෙන් රුපියල් පන්දහසකුත්, මත්පැන් කාලකුත් ලබා දීම පිළිබඳ තොරතුරු ලැබී තිබුණා. නමුත්, ඔවුන්ගේ ඡන්දය අපට ලබා දෙන බව අපේ සහෝදරවරුන්ට සපථ කර තිබුණා.



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික, මහාචාර්ය ලියනගේ අමරකීර්ති

ආර්ථික අර්බුදය හමුවේ අවුරුදු නවයක පමණ පොඩි දරුවන්ට පවා ශ්‍රමය විකිණීමට සිදු වීම පිළිබඳ අත්දැකීමක් අපට බෙදා ගන්න තිබෙනවා. කුරුණෑගල ජීවත් වන එක් අවුරුදු නවයක පුතෙක් ඥාති ගෙදරක වළං සෝදමින්, තමන්ගේ කුසගින්න නිවා ගැනීමට රහසින් දංකුඩ කන මට්ටමට මේ රට පාලනය කළ පාලකයන් රට ඇදදමා තිබෙනවා. මේ තත්වය වෙනස් කරන්න ජාතික ජන බලවේගය වටා ජනතාව රොදබඳිමින් සිටිනවා. දුප්පත්කම වාගේම දෙමළ ජනතාවට වේදනා ගෙන දෙන ප්‍රධාන කාරණයක් වන්නේ දෙමළ භාෂාවෙන් රාජ්‍ය ආයතනවලින් වැඩ කරගත නොහැකි වීමයි.

අපේ පේරාදෙණිය 11 වැනි පිටුවට

# ජනතාව එකහඬින් කියන්නේ දුෂ්ට පාලනය අවසන් කළ යුතු බවයි

යාපනයට, අනුරාධපුරයට, කොළඹට සහ මාතරට එක් වී සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාව එකහඬින් කියා සිටින්නේ මේ දූෂිත, දුෂ්ට පාලනය අවසන් කළ යුතු බව යැයි ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ප්‍රකාශ කළේය.

සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ බව පැවසුවේ මාතර වෙරළ උද්‍යානයේ පැවැත්වූ ජාතික ජන බලවේගයේ මැයි දින රැලියේදීය. ඔහු එහිදී වැඩිදුරටත් මෙසේද පැවසීය.




1886දී ඇමෙරිකාවේ හේමාකට් නගරයේ දී පැය අටක වැඩ දිනයක් ඉල්ලා සුදු කොඩි අරන් අරගල කළ නිරායුධ ජනතාවට එරෙහිව මර්දනයක් දියත් කළ දිනය මුල් කරගෙන ලෝකවාසී ජනතාව මැයි දිනය සමරනවා. ලංකාවේ පාලකයෝත් මේ දිනය සමරමින්, විවිධ නාඩගම් නටනවා. රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂ නඩය, සමගි ජන බලවේගයේ ඉතිරි වී සිටින කණ්ඩායම සහ පොහොට්ටුවේ පිරිස සමඟ මැයි දිනය සමරන ආකාරය ඉලක්කම්වලින් ප්‍රකාශ කළත්, ජාතික ජන බලවේගයේ ශක්තිය පෙන්වමින්, මාලිමාවේ අපට තරගයක් තිබෙන්නේ අපිත් එක්කම බව තහවුරු කර තිබෙනවා. රනිල් එක්ක, සජිත් එක්ක හෝ වෙන කිසිවකු එක්ක අපට තරගයක් නැහැ. තරගය පවතින්නේ බලය ලබාගෙන මේ මාතෘභූමිය පොහොසත් කිරීමේ සහ ලස්සන කිරීමේ තරගයක් විතරයි අපට තිබෙන්නේ.



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සුනිල් හඳුන්නෙත්ති

රනිල් වික්‍රමසිංහට කෘතවේදීත්වය පළ කිරීමේ මැයි රැලියක් එක්සත් ජාතික පක්ෂය පවත්වනවාලු. 1980 ජූලි වැඩ වර්ජනයේ දී වර්ජකයන් ලක්ෂයක් පමණ පාරට දාන්න රනිල් වික්‍රමසිංහ අත ඉස්සූ නිසා ද ඔහුට කෘතවේදීත්වය පළ කරන්නේ ? ඒ වාගේම මහ බැංකුව කොල්ලකෑම කළ නිසාද? ඊයේ රාත්‍රියේ තෙල් මිල අඩු කළා කියලා අද කයිවාරු ගහන්න ක්‍රියා කරන නිසා ද? ඒ වාගේම වතු ජනතාවගේ පඩි වැඩි කරන බවට ගැසට් ගැසූ 11 වැනි පිටුවට

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.